

# 05 ජාත්‍යන්තර සබඳතා

## හැඳින්වීම

මිනිසා අතීතයේ දී තම මූලික අවශ්‍යතා රට තුළින් ම සපුරාගත් බැවින් වෙනත් රාජ්‍යයන් සමඟ පැවති සබඳතා බොහෝ දුරට සීමා විය. කල්යත් ම ජනගහන වර්ධනය හා අවශ්‍යතා සංකීර්ණය වීම හේතුකොටගෙන රාජ්‍යයන් අතර සබඳතා වර්ධනය වීමට පටන් ගත්තේ ය. දේශ ගවේෂණය, කාර්මික විප්ලවයේ බලපෑම, නව රාජ්‍යයන් සොයා ගැනීම හා ඒවා අතර සබඳතා පවත්වාගෙන යාමට මිනිසා උනන්දු විය. විශේෂයෙන් කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස අමුද්‍රව්‍ය ලබා ගැනීමේ සහ නිමි භාණ්ඩ විකුණා ගැනීමේ අවශ්‍යතාව මත රාජ්‍යයන් අතර වාණිජමය සබඳතා ගොඩ නැගෙන්නට විය. මේ අරමුණු මත යටත් විජිත ඇති කර ගැනීමටත් තම දේශපාලන බලය යටත් විජිත කෙරෙහි පතුරුවාලීමටත් බලවත් රටවල් සමත් විය. වෙළෙඳාම ඔස්සේ තම ආගම් පතුරුවාලීමට ද එම රාජ්‍යයන් විසින් උත්සාහ ගනු ලැබී ය.

දෙවන ලෝක යුද්ධය අවසන් වීමත් සමඟ රාජ්‍යයන් අතර සබඳතා ශීඝ්‍රයෙන් වර්ධනය විය. විවිධ ක්ෂේත්‍ර ඔස්සේ මෙම සබඳතා වර්ධනය විය.

- රාජ්‍ය තාන්ත්‍රික සබඳතා.
- වෙළෙඳ සබඳතා.
- සංස්කෘතික සබඳතා.
- තාක්ෂණික සබඳතා.

මෙම සබඳතා පදනම් කරගෙන ලෝකය එන්න එන්න ම කුඩා වන්නට විය. විශේෂයෙන් නූතන තාක්ෂණික දියුණුවත් සමඟ සන්නිවේදන ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් සිදු වී ඇති අතර ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වෙමින් තිබේ. මේ නිසා ම ලොව කිසිදු රාජ්‍යයකට සෙසු රාජ්‍යයන්ගෙන් වෙන් ව හුදකලා පැවැත්මක් ඇති කර ගැනීම අපහසු ය. ජාත්‍යන්තර සබඳතා මත රජ්‍යයන්ගේ අන්‍යෝන්‍ය රඳා පැවැත්ම තීරණය වේ.

මෙම අන්‍යෝන්‍ය රඳා පැවැත්ම බොහෝ දුරට ගොඩනැගී ඇත්තේ දේශපාලන, ආර්ථික, සමාජ, ඓතිහාසික හා සංස්කෘතික සමානතා සමුදායක් පදනම් කොටගෙන ය. එම ක්‍රියාවලි මුල් කර ගෙන රාජ්‍යයන් අතර ඇතිවන අන්තර් සම්බන්ධතා මඟින් රාජ්‍යයන් අතර සමීප බව හෝ දුරස්ථ බව තීරණය වේ. එනම් මිතුරු සබඳතා හෝ සතුරු සබඳතා ඇතිවිය හැකි ය. ඒ ඒ රාජ්‍යයන් විසින් අනුගමනය කරන දේශපාලන දෘෂ්ටිය පදනම් කරගෙන එම සබඳතාවේ ස්වරූපය තීරණය වේ.

මෙයට අමතර ව ජාත්‍යන්තර සබඳතාවයේ ස්වරූපය තීරණය වීමට රාජ්‍යයන් තුළ ඇති වන්නා වූ වෙනස්කම් මෙන් ම ලෝක පරිමාණ මට්ටමෙන් සිදුවන වෙනස්කම් ද බලපෑ හැකි ය. එනම් රාජ්‍යයන් තුළ ආණ්ඩු වෙනස්වීම් හා ජාතික අභිලාෂ වෙනස්වීම් නිසා ජාත්‍යන්තර සබඳතාවයේ ස්වරූපය වෙනස් විය හැකි ය.

ජාත්‍යන්තර සබඳතා යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ ව ඉදිරිපත්කර ඇති අර්ථකථන කිහිපයක් පහත දැක්වේ.

"ජාත්‍යන්තර සබඳතා යනු ජාතීන් අතර පවත්නා සියලු ම ආකාරයේ සබඳතාවන් ය."

"රාජ්‍යයන්හි බලයලත් නැතහොත් අවසරලත් නිලධාරීන් විසින් පවත්වන්නා වූ රාජ්‍ය මට්ටමේ සබඳතාවයකි."

"ජාත්‍යන්තර සබඳතා යනු ජාතීන් අතර පවත්නා සියලු ම ආකාරයේ සහසම්බන්ධතා හා ජාතික දේශ සීමාවන්ගෙන් ඔබ්බෙහි සිදු වන සියලු ම ආකාරයේ මානුෂික සංසරණයන් මෙන් ම අදහස්, සිතිවිලි හා භාණ්ඩ හා සේවා අතින් ද සිදුවන සංසරණය යි.

(ෆෙඩ්‍රික් එච්. හාට්මන්)

"ජාත්‍යන්තර සබඳතා යනු රාජ්‍ය හෝ දේශ සීමාවන්ගෙන් ඔබ්බෙහි පවත්වනු ලබන සියලු ම ආකාරයේ සබඳතා අදහස් වේ. ඒවා ආර්ථික, නෛතික, දේශපාලනික හෝ වෙනත් ස්වභාවයකින් යුක්ත ඒවා වුව ද පෞද්ගලික හෝ රාජ්‍ය මට්ටමේ සබඳතා වුව ද ඒ සියල්ල නොතකා රාජ්‍ය දේශසීමාවක එක කොනකින් හටගෙන එහි අනෙක් කෙලවර දක්වා බලපෑම් කරන්නා වූ සියලු ම ආකාරයේ මානුෂික චරිතයන් ය."

ට්‍රින්වී මැතිසන්

මේ අනුව බලනවිට නූතන ජාතික රාජ්‍යන් අතර පවතින රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ආර්ථික, සංස්කෘතික, දේශපාලන, සමාජයීය යන සියලු ම ආකාරයේ සබඳතා ජාත්‍යන්තර සබඳතා බව පැහැදිලි ය.

ජාත්‍යන්තර සබඳතා ප්‍රධාන අංශ දෙකක් ඔස්සේ පවත්වාගෙන යනු ලැබේ.

1. රාජ්‍ය උපාය සම්බන්ධතා.
2. යුධ උපාය සම්බන්ධතා.

රාජ්‍ය උපාය යනුවෙන් අදහස් වන්නේ ජාතීන් අතර සාමකාමී මාධ්‍ය මඟින් ඇති කර ගන්නා සම්බන්ධතාවයන් ය. තානාපතිවරු, මහකොමසාරිස්වරු යන රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් මඟින් මෙම සබඳතා පවත්වාගෙන යනු ලැබේ. මෙයට අමතර ව රාජ්‍ය දූත මෙහෙවර හා විශේෂ පුද්ගලයන් යෙදවීම මාර්ගයෙන් මෙම සබඳතා පවත්වාගෙන යනු ලැබේ. මේ සඳහා රාජ්‍යයන් අනුගමනය කරන විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය බලපායි. විදේශ ඇමතිවරු හමුවීම, රාජ්‍ය නායකයින් හමු වීම, ජාත්‍යන්තර සමුළු, ජාත්‍යන්තර ගිවිසුම්, ජාත්‍යන්තර සංවිධාන වැනි මාධ්‍ය ඔස්සේ ද මෙම සාමකාමී සබඳතා පවත්වාගෙන යනු ලැබේ. මෙමගින් එක් එක් රාජ්‍යන්ගේ අවශ්‍යතා සපුරාගත හැකි ය.

යුධ උපායාත්මක සබඳතා යන්නෙන් අදහස් වන්නේ යුධමය වශයෙන් රාජ්‍ය අතර පවතින සබඳතාව යි. මෙම යුධ උපායාත්මක සබඳතා අවශ්‍ය වන්නේ, රාජ්‍යයේ ස්වාධිපත්‍යය ආරක්ෂා කර ගැනීමට හා බාහිර බලපෑම් සමනය කිරීම සඳහා යි. ඒ අනුව අවි ආයුධ රැස් කිරීම, යුධ පුහුණුව ලබා දීම, යුධමය වශයෙන් අවශ්‍ය විශේෂඥ ඥානය මේ ඔස්සේ ලබාගනු ඇත. ලෝකයේ බල සමතුලිතතාවය පවත්වා ගෙන යාම සඳහා ද යුධ උපායාත්මක සබඳතාව වැදගත් වේ. මෙය ලෝක බලවතුන් අතර පවතින

අදෘෂ්‍යමාන ගැටුම්කාරි තත්ත්වයෙන් පිළිබිඹු වේ. දෙවන ලෝක යුද්ධයෙන් පසු ව ඇති වන සීතල යුද්ධමය තත්ත්වය මෙයට උදාහරණ වේ. විශේෂයෙන් න්‍යෂ්ටික අවි නිෂ්පාදනය දක්වා යොමු වූ තත්ත්වයක් තුළ බලයෙන් ම බලය මර්දනය කිරීමට ගත් උත්සාහයන් මෙමගින් හඳුනාගත හැකි වේ. නූතනයේ එවැනි සීතල යුද්ධමය පසුබිමක් නොතිබුණ ද බල ව්‍යාප්තියේ අඛණ්ඩ ස්වරූපය එයාකාරයෙන් ම පවතී. මෙවන් පසුබිමක් යටතේ ලෝක බල සමතුලිතතාව ආරක්ෂාකර ගැනීම යුධ උපායාත්මක සබඳතාවල හරය වේ.

ජාතීන් අතර නැතිනම් රාජ්‍ය අතර රාජ්‍ය උපායාත්මක සහ යුධ උපායාත්මක සබඳතා පවත්වාගෙන යාම ජාත්‍යන්තර සබඳතාවල මූලික තේමාව වේ. ජාත්‍යන්තර ලෝකයේ සිදු වන සියලු ම ක්‍රියාකාරකම් සහ සියලු ආකාරයේ අන්තර් ක්‍රියාකාරකම් මෙන් ම ඒවා හසුරුවන බලවේගයන් ද, රාජ්‍යමය හෝ රාජ්‍යමය නොවන සියලු සබඳතා ජාත්‍යන්තර සබඳතාවලින් නිරූපණය වේ.

## ජාත්‍යන්තර සබඳතා සඳහා පාදක වන සාධක

### භාණ්ඩ හුවමාරුව

රාජ්‍යයක භූ දේශපාලනික පිහිටීම, සම්පත් ව්‍යාප්තිය ආදී කරුණු පදනම් කර ගෙන එහි නිෂ්පාදන කටයුතු තීරණය වේ. ඕනෑම රටකට තම රටට අවශ්‍ය සියල්ල නිපදවා ගැනීමට හැකියාවක් නොමැත. මේ නිසා එක් එක් රටවල් තම රටේ පහසුවෙන් නිපදවිය හැකි භාණ්ඩ පමණක් නිපදවීමටත් අවශ්‍ය අනෙකුත් භාණ්ඩ වෙනත් රටවලින් ගෙන්වා ගැනීමටත් පුරුදු විය. නිදසුන් ලෙස ආහාර ද්‍රව්‍ය පෙන්වා දිය හැකි ය. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය රටවල් අතර හුවමාරු කර ගත් නිසා ලෝකයේ රටවල් අතර සහයෝගීතාව වර්ධනය විය.

බටහිර යුරෝපයේ ඇති වූ කාර්මික විප්ලවය හේතු කොටගෙන යුරෝපා රටවල නිෂ්පාදන වෙනත් රටවල අලෙවි කර ගැනීමට සිදු වීම හේතුවෙන් මෙම සබඳතා තවදුරටත් වර්ධනය විය. කාර්මික නිෂ්පාදනවලට අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රත්‍යන්ත දේශයන්ගෙන් ලබාගත් අතර, නිෂ්පාදන අලෙවි කර ගැනීමට ද වෙළෙඳපළක් අවශ්‍ය විය. මේ සඳහා යුරෝපා බලවතුන් විසින් තෝරා ගන්නා ලද්දේ ආසියානු, අප්‍රිකානු සහ ලතින් ඇමරිකානු රටවල් ය. මේ මාර්ගයෙන් යුරෝපා රටවල් දියුණු ආර්ථිකයක් හිමි රටවල් බවට පත්විය.

එයට සාපේක්ෂ ව නොදියුණු රටවල් තාක්ෂණික අතින් දියුණු රටවල් කෙරෙහි යැපෙන්නට යොමු විය. එනම් තාක්ෂණික ඥානය ලබා ගැනීමට සිදුවිය. මේ නිසා සංවර්ධිත රටවල ඇති ශිල්පීය ඥානය, ප්‍රාග්ධනය, දියුණු යන්ත්‍රෝපකරණ ආදිය ලබා ගැනීමට යටත් විජිත වශයෙන් පැවැති රාජ්‍ය පෙලඹී ඇත.

වර්තමානය වන විට මුළු ලෝකය ම පාහේ වෙළෙඳපළ ආර්ථික රටාවකට හුරු වී ඇති අතර ඒ අනුව අන්තර් රාජ්‍ය රඳා පැවැත්මක් හඳුනාගත හැකි ය. ආහාර පාන, රෙදිපිළි වැනි මූලික අවශ්‍යතාවන් පමණක් නොව අතිරේක සෑම අවශ්‍යතාවක් ම සපුරා ගැනීමට උත්සාහ ගන්නේ ජාත්‍යන්තර සහයෝගීතාවයෙනි.

## තාක්ෂණික හුවමාරුව

සංවර්ධිත කාර්මික රටවලින් දියුණු තාක්ෂණික ශිල්ප ක්‍රම ලබා ගැනීමට සංවර්ධනය වෙමින් පවතින රටවල් උත්සාහ කරනු ලැබේ. ඇඟලුම් කර්මාන්තය, නාවික ගුවන් හා ගොඩබිම් වැනි ප්‍රවාහන ක්ෂේත්‍ර, සෞඛ්‍ය, අධ්‍යාපන, ඉදිකිරීම් යනාදී සෑම ක්ෂේත්‍රයක ම සංවර්ධනයට ජාත්‍යන්තර ව සිදුවූ තාක්ෂණික හුවමාරුව ද බලපා තිබේ.

## සන්නිවේදන මාධ්‍ය

නූතන සන්නිවේදන මාධ්‍යවල දියුණුව ද ජාත්‍යන්තර සහයෝගිතාව වර්ධනය කරගැනීමට ආධාර වී ඇත. නිදසුන් ලෙස අන්තර්ජාල ව්‍යාප්තිය දැක්විය හැකි ය. ක්ෂණයකින් ලොව සිදුවන ඕනෑ ම සිදුවීමක් ලොව ඕනෑම තැනක සිටින්නෙකුට දැන ගැනීමේ පහසුකම මෙමගින් හිමි වී තිබේ. නව සොයා ගැනීම්, තාක්ෂණික ඥානය, පමණක් නොව වෛද්‍ය උපදෙස් ද ක්ෂණයකින් ලබා ගැනීමට හැකියාව නූතන මිනිසා අත්කරගෙන සිටියි. මේ අනුව සන්නිවේදන ක්ෂේත්‍රයේ ශීඝ්‍ර දියුණුව ජාත්‍යන්තර වශයෙන් විශාල පිබිදීමකට පාදක වී ඇත. මේ නිසා ඕනෑ ම මොහොතක ජාත්‍යන්තර වශයෙන් රාජ්‍යයන් බද්ධ වී ඇත. රහසේ කිසිවක් කළ නොහැකි මට්ටමට අද සන්නිවේදන මාධ්‍යයේ බලපෑම ඉහළට පැමිණ ඇත. පුද්ගලයකුට, ජන වර්ගයකට, රටකට තනි ව ජීවත් වීමට නොහැකි මට්ටමට අද පත් ව තිබේ.

## ජාත්‍යන්තර උදව් උපකාර

ලෝකයේ බොහෝ රටවල් ස්වභාවික උවදුරුවලට නිරන්තර ව ගොදුරු වේ. භූමි කම්පා, ගංවතුර, නියං, සාගත, නායයාම් සහ සුනාමි හා සුළි සුළං වැනි තත්ත්වයන්ට මුහුණ පෑමට සිදුවී තිබේ. මෙවැනි මහා පරිමාණ විපත් සිදු වූ විට ඒවාට තනි ව මුහුණ දීමට රාජ්‍යයන්ට අපහසු වී තිබේ. එබඳු අවස්ථාවලට ගොදුරු වූ විට ජාත්‍යන්තර ප්‍රජාව

විවිධ ක්‍රමවලින් උදව්කරන ආකාරයක් දැකගත හැකි ය. නිදසුන් ලෙස 2004 දෙසැම්බර් 26 වෙනි දින ශ්‍රී ලංකාව ඇතුළු රාජ්‍යයන් කිහිපයකට බලපෑ සුනාමි අවස්ථාවේ ජාත්‍යන්තර ප්‍රජාව ක්‍රියාත්මක වූ ආකාරය දැකගත හැකි ය. ආහාර පාන, ඖෂධ, රෙදිපිළි, කූඩාරම් වැනි ද්‍රව්‍ය ආධාර පමණක් නොව සහන සේවා භට කණ්ඩායම් හා වෛද්‍යවරු පවා ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ලැබිණි.

ලෝකයේ ගැටුම් පවතින ප්‍රදේශවල අවතැන්වන ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු කිරීමට ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ලැබෙන සහයෝගය ද මෙයට ඇතුළත් ය. රාජ්‍යයන්ගේ සෘජු මැදිහත්වීමෙන් සහ ජාත්‍යන්තර රාජ්‍ය සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධානවල මැදිහත්වීමෙන් උපකාර සිදු කරන ආකාරය දැකගත හැකි ය.

### මානව සම්පත් ප්‍රවර්ධනය.

භෞතික සම්පත්වලින් පමණක් නොව මානව සම්පත්වලින් ද ජාත්‍යන්තර ප්‍රජාව උදව් උපකාර කරගන්නා ආකාරය දැකගත හැකි ය. විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රය ඔස්සේ විශේෂඥයන් පුහුණු කිරීම, විශේෂඥ ඥානය ලබා දීම වැනි ජාත්‍යන්තර අධ්‍යාපනික හුවමාරු වැඩ සටහන් ක්‍රියාත්මක වන ආකාරය දැකගත හැකි ය.

### සහයෝගය.

රාජ්‍යයන් අතර පවත්නා සම්බන්ධතා මිනිසාගේ දියුණුවට අත්‍යවශ්‍ය ය. ජනගහණ වර්ධනය, අවශ්‍යතා සංකීර්ණ වීම, සම්පත් සීමිත වීම වැනි තත්ත්ව තුළ රාජ්‍යයකට හුදකලාව ජීවත් වීම අපහසු ය. අන්‍යෝන්‍ය සහයෝගයෙන් හා සහජීවනයෙන් කටයුතු කිරීම සංවර්ධනය කරා ළඟා වීමට රුකුලකි. නූතන ලෝකයේ බොහෝ රාජ්‍යයන් ආර්ථික, සමාජයීය, සංස්කෘතික, තාක්ෂණික මෙන් ම දේශපාලනමය වශයෙන් ද ඉහළ මට්ටමකට පැමිණ ඇත්තේ ජාත්‍යන්තර සහයෝගීතාවයෙනි. ජාත්‍යන්තර සම්බන්ධතාවලින් වියුක්ත ව ජාත්‍යන්තර සාමය කිසි දිනක ලබාගත නොහැකිවනු ඇත. එබැවින් ජාත්‍යන්තර සබඳතා ලෝකයේ පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් ව ඇති ආකාරය දැකගත හැකි වේ.

**ක්‍රියාකාරකම් 5 - 1**

1. "ජාත්‍යන්තර සබඳතාවල වැදගත්කම" මැයෙන් බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කරන්න.

## බලපෑම් ඇති කරන රටවල් හා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති විය හැකි බලපෑම්

නූතන ජාත්‍යන්තරය තුළ විවිධ අංශවලින් රාජ්‍යයන් කෙරෙහි බලපෑම් කරන ආකාරය දැකගත හැකි ය. විශේෂයෙන් ආර්ථික, දේශපාලන හා යුධමය වශයෙන් බලවත් රටවල් එම අංශවලින් දුබල රාජ්‍යයන් කෙරෙහි විවිධ මට්ටම්වලින් බලපෑම් කරයි.

න්‍යෂ්ටික බලය හිමි, ආර්ථිකමය වශයෙන් බලවත් හා යුධ ශක්තිය ඉහළ මට්ටමක පවතින රාජ්‍යයන්ට, අනෙකුත් රාජ්‍යයන් කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව වැඩි වේ.

ප්‍රබල රාජ්‍යයන් පහත සඳහන් ක්ෂේත්‍රවල දී දුබල රාජ්‍යයන් කෙරෙහි බලපෑම් කරයි.

1. ජාත්‍යන්තර වෙළෙඳාම
2. ණය සහ ආධාර දීම
3. සාම ක්‍රියාවලිය
4. ආර්ථික කටයුතු
5. ආරක්ෂක කටයුතු

මෙම ක්ෂේත්‍රවලින් ශ්‍රී ලංකාව කෙරෙහි ප්‍රබල රාජ්‍යයන් විසින් කරන බලපෑම මීළඟට සලකා බලමු. ශ්‍රී ලංකාවේ පිහිටීම පෙරදිග හා අපරදිග රාජ්‍යයන්ගේ බලපෑමට ලක්වීම කෙරෙහි හේතු වී ඇත.

## ජාත්‍යන්තර වෙළෙඳාමේ දී

ජාත්‍යන්තර වෙළෙඳාමේ දී ප්‍රබලයින් ලෙස පෙනී සිටින්නේ සංවර්ධිත රාජ්‍යයන් ය. සංවර්ධනය වෙමින් පවතින රටවල් බොහෝ දුරට අපනයනය කරන්නේ ප්‍රාථමික වෙළෙඳ භාණ්ඩ ය. එම භාණ්ඩවලට දියුණු රටවල භාණ්ඩවලට මෙන් ලෝක වෙළෙඳපළේ ස්ථාවර මිලක් නො ලැබේ. මේ නිසා එම රටවල විදේශ විනිමය ඉපැයීම් ද අඩු වේ.

මෙයට අමතර ව ජාත්‍යන්තර වෙළෙඳාමේ දී ප්‍රවාහන සේවා ප්‍රධාන වශයෙන් පවත්වා ගෙන යන්නේ සංවර්ධිත රටවල් මගිනි. භාණ්ඩ ප්‍රවාහනය කරන නැව්වලින් වැඩි කොටසක් සංවර්ධිත රටවල්වලට අයත් වේ. මේ නිසා වෙළෙඳ කටයුතුවල දී නැව් ගාස්තු හා රක්ෂණ ගාස්තු වශයෙන් අධික මුදලක්, සංවර්ධිත රටවලට ගෙවීමට සංවර්ධනය වෙමින් පවතින රටවලට සිදු වේ.

එසේ ම සංවර්ධිත රටවල් විසින් අනුගමනය කරන ආරක්ෂණ පිළිවෙත් ජාත්‍යන්තර වෙළඳාමේ දී බලපායි. නිදසුන් ලෙස සංවර්ධිත රටවල් ආනයන පාලනය කිරීම සඳහා අනුගමනය කරන සලාක ක්‍රමය දැක්විය හැකි ය. ඇමෙරිකාව විසින් ශ්‍රී ලංකාවේ ඇඟලුම් සලාකය අවසාන කිරීම මෙයට නිදසුන් වේ. මෙය සංවර්ධනය වෙමින් පවතින රටවල නිමි භාණ්ඩ අලෙවි කිරීමේ දී දුෂ්කරතා මතු කරයි.

## ණය සහ ආධාර දීමේ දී

ණය සහ ආධාර දීම ඔස්සේ ද සංවර්ධිත රටවල් සංවර්ධනය වෙමින් පවතින රටවලට බලපෑම් කරයි. විශේෂයෙන් ශ්‍රී ලංකාව ගත් විට ශ්‍රී ලංකාවට ආධාර ලබා දෙන රටවල් ආධාර නිකුත් කිරීමේ දී විවිධ කොන්දේසි දැමීම නිදසුන් ලෙස දැක්විය හැකි ය. ණය නිකුත් කිරීමේ දී ණයට සරිලන භාණ්ඩ තම රටින් ම ලබා ගන්නා ලෙස දැනුම් දෙන අවස්ථා දැක ගත හැකි ය. එමෙන් ම ණය හෝ ආධාර සපයන රටවලට අවශ්‍ය පරිදි ප්‍රමුඛ ව්‍යාපෘති තෝරා ගැනීම, ණය පොළී හා ණය වාරික ගෙවීමේ කාල සීමා හා ප්‍රමාණය තීරණය කිරීම මත සංවර්ධනය වෙමින් පවතින රටවලට දැඩි කොන්දේසිවලට යටත්වීමට සිදු වේ.

## සාම ක්‍රියාවලියේ දී

ලෝක සාමය හා සුරක්ෂිතභාවය පවත්වාගෙන යාමේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විශාල කාර්ය භාරයක් සිදු කරයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රබලයෝ ලෙස කටයුතු කරන්නේ ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයෝ ය. රාජ්‍යයන් අතර හෝ රාජ්‍යයන්ගේ අභ්‍යන්තර ගැටුම් ඇතිවන විට අදාළ රාජ්‍යයන්ගේ ඉල්ලීම පරිදි හෝ ආරක්ෂක මණ්ඩලය මෙම කටයුතුවලට මැදිහත් වේ. ආර්ථික සම්බාධක පැනවීම සාකච්ඡා මාර්ගයෙන් ප්‍රශ්න විසඳා ගැනීමට බලකිරීම වැනි මාර්ගයන්ගෙන් බලපෑම් කරයි. සාම සාධක හමුදව යෙදවීම මගින් ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට කටයුතු යෙදීම ද බලපෑම් කිරීමේ ක්‍රමයකි.

ශ්‍රී ලංකාව පැත්තෙන් ගත්විට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ත්‍රස්තවාදී ක්‍රියා පදනම් කරගෙන ආරක්ෂක මණ්ඩලය මෙන් ම ප්‍රබල රාජ්‍යයන් විසින් ද සාකච්ඡා මාර්ගයෙන් ගැටුම් විසඳා ගන්නා ලෙස බලපෑම් කරනු ලැබී ය. නිදසුන් ලෙස ඇමෙරිකාව, ජපානය, නෝර්වේ, වැනි රාජ්‍යයන් විසින් සිදු කරන ලද බලපෑම් මෙයට නිදසුන් වේ.

## ආර්ථික කටයුතුවල දී


රාජ්‍යයක ආර්ථික කටයුතු පවත්වාගෙන යාමේ දී රාජ්‍යයන් බලපෑම් කරන ආකාරය දැකගත හැකි ය. විශේෂයෙන් ඔපෙක් සංවිධානයට අයත් රාජ්‍යයන් විසින් ශ්‍රී ලංකාව කෙරෙහි විශාල බලපෑමක් කරනු ලැබේ. රටේ නිෂ්පාදන කටයුතු බොහොමයක් ම ඉන්ධන මත රඳා පවතී. එබැවින් ඛණිජ තෙල් ආනයනය සඳහා විශාල ධනස්කන්ධයක් වැය කිරීමට සිදු වේ. තෙල් මිල ඉහළ යාම පමණක් නොව භාවිතය වැඩි වීම නිසා ඛණිජතෙල් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල බලපෑමක් සිදු කරයි.

## ආරක්ෂක කටයුතුවල දී

ආරක්ෂක කටයුතුවල දී ප්‍රබල රාජ්‍යයන්ගේ බලපෑමට දුබල රාජ්‍යයන් යටත් වේ. ආරක්ෂාව සම්බන්ධ ව තාක්ෂණික ඥානය හා තාක්ෂණික උපකරණ බොහොමයක අයිතිය පවතින්නේ ප්‍රබල රාජ්‍යයන්ට ය. ඔවුහු එම තාක්ෂණික ඥානය හා උපකරණ අනෙකුත් රටවලට ලබාදීමේ දී විවිධ කොන්දේසි ඉදිරිපත් කරති.

### රැකියා සැපයීම

ශ්‍රී ලංකාවේ රැකියා සපයන ශ්‍රම වෙළෙඳපොළට ඇතුළත් මැද පෙරදිග කලාපයේ රටවල් හා යුරෝපා සංගමයට අයත් රටවල් මෙහි ප්‍රධාන තැනක් ගනියි. රැකියා සැපයීම සීමා කිරීම, අවම සුදුසුකම් නියම කිරීම, ප්‍රේෂණ සඳහා කොන්දේසි පැනවීම වැනි ක්‍රම ඔස්සේ එම රටවල් බලපෑම් කරයි.



**ක්‍රියාකාරකම් - 5.2**

ජාත්‍යන්තර සම්බන්ධතාවල දී ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කළ හැකි බලපෑම් සාකච්ඡා කරන්න.

## ජාත්‍යන්තර සංවිධාන

### හැඳින්වීම

සාමාන්‍යයෙන් රාජ්‍යයන් තුනක් හෝ වැඩි ගණනක් අතර පොදු අරමුණු කිහිපයක් ඉටු කර ගැනීම සඳහා කිසියම් සම්මුතියකට එළඹ ඇතිකර ගන්නා සංවිධාන ජාත්‍යන්තර සංවිධාන යන්නෙන් අදහස් කෙරේ. මෙවැනි සංවිධාන අන්තර් රාජ්‍ය මට්ටමෙන් ඇති කර ගන්නා සංවිධාන මෙන් ම රාජ්‍යය නොවන මට්ටමෙන් ඇති කර ගන්නා සංවිධාන ද දැක ගත හැකි ය. රාජ්‍යය මට්ටමින් ඇතිකර ගන්නා සංවිධාන රාජ්‍යමය සංවිධාන යනුවෙන් ද රාජ්‍යයන් අතර පුද්ගල මට්ටමෙන් ඇතිකර ගන්නා සංවිධාන රාජ්‍යමය නොවන සංවිධාන වශයෙන් ද හැඳින්වේ.

ජාත්‍යන්තර සම්බන්ධතාවල දී දැකගත හැකි සුවිශේෂ ලක්ෂණය ජාත්‍යන්තර සංවිධාන පිහිටුවා ගැනීම යි.

විසි වන සියවසේ දෙවන භාගයෙන් පටන් ගන්නා කාල පරිච්ඡේදය තුළ ජාත්‍යන්තර සම්බන්ධතාවල කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ ජාත්‍යන්තර සංවිධානවල වර්ධනයක් ඇති වීම යි. ජාත්‍යන්තර දේශපාලනය කෙරෙහි මෙන් ම රාජ්‍යයන්ගේ අභ්‍යන්තර හැසිරීම් කෙරෙහි ද එමගින් දැඩි බලපෑමක් කර ඇත. 19451024 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානය නිල වශයෙන් ආරම්භ කරන විට ලෝකයේ ජාත්‍යන්තර සංවිධාන තිබුණේ කිහිපයක් පමණි. එනම් 1874 10 09 වන දින බර්ලින් ගිවිසුම යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර තැපැල් සංගමය සහ 1919 වර්සෙල්ස් සාම සම්මුතිය යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයත් පමණි. නමුත් 1945 න් පසු කාලය තුළ ජාත්‍යන්තර සංවිධාන නොකඩවා ම ව්‍යාප්ත වන ආකාරය දැකිය හැකි වේ. ඒ අනුව අදවන විට ජාත්‍යන්තර සංවිධාන දහස් ගණනක ක්‍රියාකාරිත්වය දැකගත හැකි ය. 21 වන සියවසට ලෝකය පා තබන විට ජාත්‍යන්තර රාජ්‍යමය සංවිධාන 297 ඉක්ම වූ අතර රාජ්‍ය නොවන සංවිධාන 5000 කට ආසන්න විය. අනාගතයේ දී මෙම ප්‍රමාණය තවදුරටත් වර්ධනය වනු ඇත. මෙසේ ඇති වූ ජාත්‍යන්තර සංවිධාන ප්‍රධාන කොටස් තුනකට වර්ග කළ හැකි ය.

1. සමස්ත ජාත්‍යන්තර ක්ෂේත්‍රය තුළ ම ආධිපත්‍යයක් පදනම් කොටගෙන ගොඩනගා ඇති සංවිධාන

   නිදසුන් : එක්සත් ජාතීන්ගේ සංවිධානය හා එහි අනුබද්ධිත සංවිධාන

2. ප්‍රාදේශීය පදනමක් යටතේ ගොඩනගන ලද සංවිධාන

   මෙම සංවිධාන කොටස් දෙකකට බෙදිය හැකිය.

   I ප්‍රාදේශීය සාමුහික සුරක්ෂිතතාව වෙනුවෙන් ගොඩනගන ලද මිලිටරි සංවිධාන

   නිදසුන් : නේටෝ, වෝර්සෝ, සිසැටෝ, සෙන්ටෝ, වැනි සංවිධාන මේවා අතරින් සමහර සංවිධාන අභාවයට ගොස් ඇත.

   II ප්‍රාදේශීය, ආර්ථික, සමාජයීය හා දේශපාලන සහයෝගීතාව සඳහා ගොඩනගන ලද සංවිධාන

   නිදසුන් : යුරෝපා ආර්ථික හවුල, ආසියාන් සංවිධානය, සාර්ක් සංවිධානය.

3. විවිධ ජාත්‍යන්තර සමුළු

   නිදසුන් : පොදුරාජ්‍ය මණ්ඩලය, නොබැඳි සමුළුව.

රාජ්‍යන්ගේ සහභාගීත්වයෙන් තොර, එහෙත් ජාත්‍යන්තර දේශපාලනය තුළ වැදගත් බලපෑමක් කරන සහ ස්වේච්ඡා පදනමක් මත සංවිධානය වූ ජාත්‍යන්තර ආයතන ද දැකිය හැකි වේ. නිදසුන ලෙස ජාත්‍යන්තර ක්ෂමා ආයතනය, ජාත්‍යන්තර රතුකරුස සංවිධානය දැක්විය හැකිය.

එසේ ම දියුණු වෙමින් පවතින රාජ්‍යවල ආර්ථික සහ සමාජයීය සංවර්ධනය අරමුණු කරගෙන පිහිටුවා ඇති ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන දැකිය හැකි ය. සමස්තයක් ලෙස ගෙන සලකා බලනවිට ජාත්‍යන්තර සංවිධාන ලෝකයේ රාජ්‍යයන්ට මනුෂ්‍ය වර්ගයාගේ යහපත තකා විවිධ මට්ටම්වලින් උපකාරී වේ. අනෙක් අතට බලපෑම් කරයි. එබැවින් ජාත්‍යන්තර සම්බන්ධතා අධ්‍යයනයක දී ජාත්‍යන්තර සංවිධාන පිළිබඳ ව අධ්‍යයනය කිරීම වැදගත් වේ.

## එක්සත් ජාතීන්ගේ සංවිධානය.

1914 1918 කලය තුළ පළමු ලෝක යුද්ධයත් 1939 1945 කාලය තුළ දෙවන ලෝක යුද්ධයත් පැවති බව ප්‍රකට කාරණයකි. මේ ලෝක යුද්ධ දෙකෙන් විශාල වශයෙන් භෞතික සම්පත් මෙන් ම මානව සම්පත් ද විනාශ විය. ඇතැම් ජන කොටස් හා සංස්කෘතීන් මිහි පිටින් තුරන් විය. මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ලෝකයේ ප්‍රබල ජාතීන් එකතු වී ක්‍රියා කළත් යුද්ධ වළක්වා ගැනීමට ඔවුහු අපොහොසත් වූහ.

පළමු ලෝක යුද්ධයෙන් පසු ව ලෝක සාමය පවත්වාගෙන යාමේ අවශ්‍යතාව දැඩි ව දැනෙන්නට විය. මේ නිසා ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති වුඩ්රෝ විල්සන් ලෝක සාමය ඇති කිරීම සඳහා ජාතීන්ගේ සාමූහික උත්සාහයක් අවශ්‍ය බව අවධාරණය කළේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ 1920 දී සාමාජිකයන් 27 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ජාතීන්ගේ සංගමයේ ගොඩනැගීම යි.


ජාතීන්ගේ සංගමයේ පැවති විවිධ දුර්වලතා නිසා ලෝක සාමය පවත්වාගෙන යාමට අපොහොසත් විය. 1939 සිට 1945 දක්වා කාලය තුළ පැවති දෙවන ලෝක සංග්‍රාමය ආරම්භ වන්නේ ජාතීන්ගේ සංගමය ශක්තිමත් සංවිධානයක් නොතිබුණු බැවිනි. දෙවන ලෝක යුද්ධයේ දී ජපානයේ හිරෝෂිමා හා නාගසාකි නගර සුළු මොහොතකින් පරමාණු බෝම්බවලින් අළු බවට පත් විය. එමෙන් ම ජර්මනියේ හිට්ලර්ගේ නාසි යුධ කඳවුර තුළ යුදෙව් ජාතිකයෝ ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් අමානුෂික අයුරින් ඝාතනය වූහ. මේ නිසා දෙවන ලෝක යුද්ධය යනු ලෝක ඉතිහාසයේ ඉතා බියකරු ම යුද්ධය විය. මෙහි ප්‍රතිඵලය වූයේ මිලියන 50 කට වැඩි සංඛ්‍යාවක් මිය යාම යි. තවත් ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් අංග විකල වූහ. අදටත් තක්සේරු කළ නොහැකි ධනස්කන්ධයක් හා දේපළ ප්‍රමාණයක් විනාශ වී ඇත.

මෙම භයංකාර විනාශය තුළින් ලෝක ප්‍රජාව ලබාගත් අත්දැකීම වූයේ තුන්වන ලෝක යුද්ධයක් ඇති වීම වළක්වා ගැනීම ය. මේ අරමුණ ඉටුකර ගැනීමට නම් ප්‍රබල හා ශක්තිමත් ජාත්‍යන්තර සංවිධානයක අවශ්‍යතාව ලෝක ප්‍රජාව තේරුම් ගත්හ. මේ අනුව තුන්වන ලෝක යුද්ධයක් ඇති වීම වැළැක්වීම සඳහාත් ලෝක සාමය ඇති කිරීම සඳහාත් පිහිටුවාගත් ජාත්‍යන්තර සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවිධානය විය.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල්ට්, බ්‍රිතාන්‍ය අගමැති වින්සන්ට් චර්චිල් හා සෝවියට් රුසියාවේ නායක ජෝසප් ස්ටාලින් යන තිදෙනාගේ ප්‍රධානත්වයෙන් 1945 අප්‍රේල් 25 හා 26 දිනවල සැන්ෆ්‍රැන්සිස්කෝ නගරයේ දී ජාත්‍යන්තර සංවිධානය පිළිබඳ සමුළුව පැවැත්විය. රාජ්‍යයන් 50 ක් එයට සහභාගී විය. මෙම සම්මේලනයට ශ්‍රී ලංකාව වෙනුවෙන් ජේ.ආර්. ජයවර්ධන මහතා සහභාගී විය. ඇමෙරිකා එක්සත් ජනපදය, සෝවියට් රුසියාව, මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය හා චීනය යන මහ බලවතුන් ප්‍රඥප්තියට අත්සන් තැබීමෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ විය. එතැන් සිට සෑම වසරක ම ඔක්තෝබර් 24 වන දින එක්සත් ජාතීන්ගේ දිනය වශයෙන් අනුස්මරණය කෙරේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO) පෘථිවිය මත රාජ්‍යයන් විශාල සංඛ්‍යාවක් නියෝජනය කරන විශාලතම ජාත්‍යන්තර සංවිධානය ලෙස හැඳින් විය හැකි ය. සාමාජික රාජ්‍යයන් 50 කින් ආරම්භ වූ මෙම සංවිධානය 2007 වන විට රාජ්‍යයන් 192ක් සාමාජිකත්වය දරා ඇත. එක්සත් ජාතීන්ගේ සංගමය සාමාජිකත්වයේ වර්ධනය 5.1 රූප සටහනින් දැක්වේ.

**එ.ජා මණ්ඩලයේ සාමාජිකත්ව වර්ධනය**




5.1 රූප සටහන

**එක්සත් ජාතීන්ගේ ලාංඡනය**



5.2 රූප සටහන

**ඔක්තෝබර් 24 වනදා එක්සත් ජාතීන්ගේ දිනයයි**

## එක්සත් ජාතීන්ගේ පරමාර්ථ හා ප්‍රතිපත්ති

### පරමාර්ථ

1. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම.
2. ජාතීන් අතර මිත්‍ර සබඳතාව වර්ධනයකර ගැනීම.
3. ජාත්‍යන්තර වූ ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා මානුෂික ප්‍රශ්න විසඳා ගැනීමට සහය වීම.
4. මිනිස් අයිතිවාසිකම්වලට හා මූලික නිදහසට ගරු කිරීමේ තත්ත්වය නංවාලීම.

ඉහත පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රතිපත්ති අනුගමනය කරනු ලැබේ.


### ප්‍රතිපත්ති

1. සියලු ම සාමාජිකයන්ට සමානත්වයෙන් සැලකීම.
2. ප්‍රඥප්තිය කෙරෙහි සියලු ම සමාජිකයන් අතර පරිපූර්ණ විශ්වාසය පවත්වාගෙන යාම.
3. සාමාජිකයන් තම ආරවුල් ජාත්‍යන්තර සාමයට හා ආරක්ෂාවට හානි නොවන අන්දමින් විසඳා ගැනීම.
4. ජාත්‍යන්තර සබඳතාවල දී තවත් රාජ්‍යයකට විරුද්ධ ව අවි බලය යෙදවීමට හෝ අවි බලය යෙදවීමට තර්ජනය කිරීමෙන් වැළකී සිටීම.
5. එක්සත් ජාතීන් ගන්නා කවර වූ හෝ ක්‍රියා මාර්ගයකට සහාය වීම හෝ එක්සත් ජාතීන් විසින් තහනම් නීති හෝ වැළැක්වීමේ ක්‍රම යොදගනු ලබන කවර රටකට හෝ උපකාර කිරීමෙන් වැළකීම.
6. කවර හෝ රාජ්‍යයක අභ්‍යන්තර නීතිමය විනිශ්චයක ම ඇතුළත් කරුණු සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයට බලයක් නොපැවරීම.

## එක්සත් ජාතීන්ගේ ව්‍යුහය

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය පිළිගන්නා සහ එයට අනුව ක්‍රියාත්මක වීමට එකඟවන ලෝකයේ සියලුම සාමකාමී ජාතීන්ට එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය විවෘතව පවතී. ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත මහා මණ්ඩලය විසින් සාමාජිකත්වය ප්‍රදානය කරනු ලැබේ. චීන, ඉංග්‍රීසි, ප්‍රංශය, රුසියානු සහ ස්පාඤ්ඤ භාෂා එක්සත් ජාතීන්ගේ නිල භාෂා වේ. මහා මණ්ඩලයේ ආරක්ෂක මණ්ඩලයේ සහ ආර්ථික හා සමාජ මණ්ඩලයේ නිල භාෂාවක් ලෙස අරාබි භාෂාව ද නම් කර ඇත.

**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය**




5.3 රූප සටහන

## එක්සත් ජාතීන්ගේ සංවිධානය සකස් වී ඇති ප්‍රධාන ආයතන හා ඒවායේ කාර්යභාරය

එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන හයක් ඇත.

1. මහා මණ්ඩලය
2. ආරක්ෂක මණ්ඩලය
3. ආර්ථික හා සමාජ මණ්ඩල
4. භාරකාර මණ්ඩලය
5. අන්තර් ජාතික අධිකරණය
6. ලේකම් කාර්යාලය

## එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතනවල බලතල හා කාර්යයන්

### 1. මහා මණ්ඩලය

- සියලු සාමාජික රටවල නියෝජිතයන් ඇතුළත් වේ. (2007 ජුලි වන විට මුළු සාමාජික සංඛ්‍යාව 192 කි.)
- වර්ෂයකට වරක් රැස්වේ. සාමාජිකයන් වැඩි දෙනෙකුගේ ඉල්ලීම මත විශේෂ රැස්වීම් කැඳවිය හැකි ය.

### බලතල හා කාර්යයන්

- නව සාමාජිකයන් බඳවා ගැනීම.
- නිරායුධකරණය සහ අවි සීමාකරණය පිළිබඳ ප්‍රතිපත්ති ඇතුළු ව ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව අරමුණු කොටගත් සහයෝගීතාව පිළිබඳ ප්‍රතිපත්ති විමර්ශනය කොට නිර්දේශ කිරීම.
- වාර්ෂික අයවැය ලේඛනය සම්මත කර ගැනීම.
- ජාත්‍යන්තර සාමයට හා ආරක්ෂාවට බාධා විය හැකි තත්ත්ව පිළිබඳ ආරක්ෂක මණ්ඩලයේ අවධානයට යොමු කිරීම.
- ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත මහ ලේකම්වරයා පත් කිරීම.

### 2. ආරක්ෂක මණ්ඩලය

- ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමේ මූලික වගකීම ආරක්ෂක මණ්ඩලයට පැවරේ.
- චීනය, ප්‍රංශය, රුසියාව, බ්‍රිතාන්‍යය, එක්සත් ජනපදය යන ස්ථාවර සාමාජිකයන් පස්දෙනා ද මහා මණ්ඩලය විසින් වසර දෙකක කාලයකට පත්කර ගනු ලබන නිත්‍ය නොවන සාමාජිකයන් 10 දෙනෙකු ද ඇතුළු මුළු සාමාජික සංඛ්‍යාව 15 කි.
- සෑම සාමාජිකයෙකුට ම එක් ඡන්දයක් හිමි වේ.

- තීරණ ගනු ලබන්නේ අවම වශයෙන් සාමාජිකයන් 9 දෙනෙකුගේවත් එකඟත්වයෙනි.

- තීරණ ගැනීම සඳහා ස්ථාවර සාමාජිකයන්ගේ ඒකමතිකභාවය උවමනා වේ. ස්ථාවර සාමාජිකයන්ගෙන් එක් අයෙකු හෝ විරුද්ධ ව ඡන්දය ප්‍රකාශ කළහොත් යෝජනාව ප්‍රතික්ෂේප වේ. එය ස්ථාවර සාමාජිකයෙකු නිශේධ බලය ලෙස හැඳින්වේ.

## බලතල හා කාර්යයන්

- එක්සත් ජාතීන්ගේ පරමාර්ථ හා ප්‍රතිපත්තිවලට අනුකූල ව ජාත්‍යන්තර ආරක්ෂාව සහ සාමය පවත්වා ගැනීම.
- ජාත්‍යන්තර ගැටුමකට තුඩු දිය හැකි ඕනෑම ආරවුලක් හෝ සිදුවීමක් පිළිබඳ ව පරීක්ෂා කිරීම.
- එබඳු ආරවුල් සමථයකට පත්කිරීමේ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ආක්‍රමණිකයෙකුට එරෙහි ව යුධමය පියවර ගැනීම.
- අවිපාලන ක්‍රමයක් ස්ථාපනය සඳහා සැලසුම් සම්පාදනය.
- ආක්‍රමණයක් වැළැක්වීම පිණිස ආර්ථික සම්බාධක සහ වෙනත් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස සාමාජික රටවලින් ඉල්ලා සිටීම.
- නව සාමාජිකයන් බඳවා ගැනීම සඳහා නිර්දේශ කිරීම.
- මහ ලේකම් පත්කිරීම පිළිබඳ මහා මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 3. ආර්ථික හා සමාජ මණ්ඩලය

- මෙය සාමාජිකයන් 54 කින් සමන්විත ය. ඔවුන්ගේ සේවා කාලය වසර තුනකි. සෑම වසර තුනකට වරක් ම සාමාජිකයන් 18 දෙනෙකුගේ නිල කාලය අවසන් වන අතර නව සාමාජිකයන් 18 දෙනෙකු පත්කෙරේ. සාමාජිකයෙකුට එක් ඡන්දයක් හිමි වේ.

- එක්සත් ජාතීන්ට අනුබද්ධිත ආයතනවල ආර්ථික හා සමාජ කාර්යයන් සම්බන්ධීකරණය භාර ප්‍රධාන අධිකාරිය ලෙස කටයුතු කරයි.

## බලතල හා කාර්යයන්

- මානව අයිතිවාසිකම් හා මූලික නිදහස සහතික කොට ආරක්ෂා කිරීම.
- අන්‍යෝන්‍ය වැදගත්කමක් සහිත ජාත්‍යන්තර ආර්ථික හා සමාජයීය විෂයයන් සාකච්ජාවට ලක් කිරීම.
- ජාත්‍යන්තර ආර්ථික, සාමාජික, සංස්කෘතික සහ අධ්‍යාපනික විෂයයන් පිළිබඳ ව අධ්‍යයනය කිරීම, වාර්තා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතන සමඟ ගිවිසුම් සකස් කිරීම.
- මණ්ඩලයට අදාළ කාර්යයන් සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධානවල උපදෙස් විමසීම.

## භාරකාර මණ්ඩලය

## බලතල හා කාර්යයන්

- භාරකාර ක්‍රමයට ගැනෙන භූමි ප්‍රදේශ පරිපාලනය හා අධීක්ෂණය කිරීම.
- භාරකාර ප්‍රදේශවල ජනතාවගේ අභිවෘද්ධිය සැලසීම, ස්වයං පාලනය හෝ ස්වාධීනත්වය වෙත ළඟාවීම සඳහා හුරුකර වීම.
- භාරකාර ප්‍රදේශවල ජනතාවගේ දේශපාලන, ආර්ථික, සාමාජික සහ අධ්‍යාපනික ප්‍රගතිය ඇති කිරීම.
- භාරකාර ප්‍රදේශවලින් ලැබෙන පෙත්සම් විභාග කිරීම
- භාරකාර ප්‍රදේශවල දූත මෙහෙවර සංවිධානය කිරීම.
- ආරම්භයේ දී භාරකාර මණ්ඩලය සඳහා පැවරුණු භූමි ප්‍රදේශ 11 විය. 1994 වන විට ඉතිරි වී තිබුණේ එක් දිවයිනක් පමණි. (ශාන්තිකර දිවයිනක් වූ පාලවු) 1994 දී එය නිදහස් රාජ්‍යයක් බවට පත්වීමෙන් පසු ව භාරකාර මණ්ඩලයේ කටයුතු ද අඩු වී ඇත.

## 5. ජාත්‍යන්තර අධිකරණය

- එක්සත් ජාතීන්ගේ ප්‍රධානතම අධිකරණ සංවිධානය මෙය වේ. මහා මණ්ඩලය සහ ආරක්ෂක මණ්ඩලය විසින් ස්වාධීන ඡන්දයෙන් තෝරා ගනු ලබන විනිශ්චයකාරවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත වේ.
- විනිශ්චයකාරවරයෙකුගේ සේවා කාලය වසර 09 කි.
- අධිකරණය රැස් වන්නේ නෙදර්ලන්තයේ හේග් නුවර යි.

## බලතල හා කාර්යයන්.

- සාමාජික රාජ්‍යයන් අන්තර්ජාතික අධිකරණය වෙත යොමු කරන සියලු ප්‍රශ්න පිළිබඳ ව අධිකරණමය බලතල හිමි වේ.
- විශේෂ අවස්ථාවල දී ගිවිසුමක් හෝ සම්මුතියකට අත්සන් තැබීමෙන් අධිකරණයේ විනිශ්චය පිළිගන්නා බවට කල්තබා ප්‍රතිඥා දීමෙන් අධිකරණය කෙරෙහි අවනතභාවය දැක්විය හැකි ය.

## 6. ලේකම් කාර්යාලය

- එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරිපාලන කාර්යාලය වේ.
- මහ ලේකම් එහි ප්‍රධාන පරිපාලන නිලධාරියා වේ. ඔහු පත්කරන්නේ පස් අවුරුදු නිල කාලයක් සඳහා ආරක්ෂක මණ්ඩලයේ උපදෙස් මත මහා මණ්ඩලය විසිනි.
- විශාල වගකීම් සම්භාරයක් ඔහුට හිමි වේ.
- ජාත්‍යන්තර ආරක්ෂාවට තර්ජනයක් විය හැකි යැ යි අදහස් කරන කුමන කාරණාවක් වුව ද ආරක්ෂක මණ්ඩලය වෙත යොමු කිරීමේ බලය ඔහු සතු වේ.
- මහලේකම්වරයා ජාත්‍යන්තර ප්‍රජාවේ ප්‍රකාශකයා ලෙස ද සාමාජික රාජ්‍යයන්ගේ සේවකයා ලෙස ද ක්‍රියා කරයි.

## එක්සත් ජාතීන්ගේ අනුබද්ධිත ආයතන

එක්සත් ජාතීන් හා අනුබද්ධිත ආයතන රාශියක් දැකගත හැකි ය.

1. පුනරුත්ථාපනය හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව (I.B.R.D) (ලෝක බැංකුව)
2. අන්තර්ජාතික මූල්‍ය අරමුදල □□□□□
3. වෙළෙඳම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය (UNCTAD)
4. ලෝක ආහාර හා කෘෂි කාර්මික සංවිධානය □□□□□
5. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය. □□□□□□□□
6. ලෝක සෞඛ්‍ය සංවිධානය □□□□□
7. ජාත්‍යන්තර කම්කරු සංවිධානය □□□□□
8. ජාත්‍යන්තර සංවර්ධන සංගමය □□□□□
9. අන්තර්ජාතික මූල්‍ය සංස්ථාව □□□□□
10. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය □□□□□□
11. ලෝක තැපැල් සංගමය □□□□□
12. අන්තර්ජාතික විදුලි පණිවුඩ සංගමය □□□□□
13. ලෝක කාලගුණ සංවිධානය □□□□□
14. ජාත්‍යන්තර සමුද්‍ර සංවිධානය □□□□□
15. ලෝක බුද්ධිමය වස්තු පිළිබඳ සංවිධානය □□□□□□
16. කෘෂිකර්මය පිළිබඳ ජාත්‍යන්තර අරමුදල □□□□□□

මෙම අනුබද්ධිත සංවිධාන අතුරින් කිහිපයක් පිළිබඳ ව අවධානය යොමු කරමු.

## එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO)

**ආරම්භය-:** 1946

**මූලස්ථානය-:** ප්‍රංශයේ, පැරිස් නුවර

යුනෙස්කෝවේ ආරම්භය පිළිබඳ මෙසේ දක්වා ඇත.

> යුද්ධය ආරම්භ වන්නේ මිනිසාගේ සිත තුළ බැවින්, සාමයේ බලකොටු ඉදි කළ යුත්තේ ද මිනිසාගේ සිත තුළ ය.

**පරමාර්ථ-** ජාත්‍යන්තර බුද්ධිමය සහයෝගීතාව තුළින් ලෝක සාමය උදකොට පවත්වා ගැනීම, දැනුවත් අධිෂ්ඨානයක්, ආදර්ශවත් අධ්‍යාපනයක් මිශ්‍ර වූ සංස්කෘතික පදනම මත හිතකර මානව සමාජයක් බිහි කිරීම යුනෙස්කෝවේ කාර්යභාරය ලෙස හැඳින්වේ. මේ සඳහා ලිවීමට හා කියවීමට උපකාර කිරීම, විවේකය අර්ථවත් ව ගත කිරීමට අවශ්‍ය පදනම සකස් කිරීම, සෞඛ්‍යය ආරක්ෂා කිරීම, ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම හා ආරක්ෂා කිරීම, ගෘහ ජීවිතය උසස් කිරීම යන අංශ කෙරෙහි යුනෙස්කෝවේ අවධානය යොමු වේ. අධ්‍යාපනය මානව සංවර්ධනයට අත්‍යවශ්‍ය අංශයක් ලෙසත් සාමය රඳා පැවැතීමට අධ්‍යාපනය ඉවහල් වන බවත් යුනෙස්කෝව තවදුරටත් පෙන්වා දී ඇත.

යුනෙස්කෝවේ ලාංඡනය පහත දැක්වේ

5.4 රූප සටහන

### ◈ යුනෙස්කෝව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සිදුකොට ඇති කාර්යයන්

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන හා සංස්කෘතික අංශයේ දියුණුවට උපකාරීවන ආයතන රාශියක් ආරම්භ කිරීමට හා දියුණු කිරීමට යුනෙස්කෝව ආධාර සපයා ඇත.

ඒවායින් කිහිපයක් පහත දැක්වේ.

- ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා ආධාර සපයා ඇත.
- ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලය, මොරටු විශ්ව විද්‍යාලය, ජාතික අධ්‍යාපන ආයතනය, බලශක්ති හා විධාන අධිකාරිය, මහවැලි ප්‍රජා ගුවන් විදුලි මධ්‍යස්ථානය, ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය යන ආයතන ආරම්භ කිරීම.
- සංස්කෘතික ත්‍රිකෝණ යෝජනා ක්‍රමය යටතේ සංස්කෘතික වශයෙන් වැදගත්වන ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමට ආධාර සැපයීම.

## එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)

**ආරම්භය**- 1946 දී
**මූලස්ථානය**- ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර පිහිටා ඇත.
**ආරම්භක පසුබිම**- දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵලයක් ලෙස දෙමාපියන් අහිමි, අනාථභාවයට පත් ලක්ෂ සංඛ්‍යාත දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම.

මෙම සංවිධානය ආරම්භයේ දී 'එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි අවස්ථා අරමුදල' (United Nations' International Children's Emergency Fund) යනුවෙන් හැඳින්විණි. යුනිසෙෆ් ලාංඡනය පහත දැක්වේ.

5.5 රූප සටහන

## අරමුණු-

- ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනයකොට තහවුරු කිරීම. මේ අනුව 1959 දී මහා මණ්ඩලය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයක් සම්මත කර ගත්තේ ය. මෙහි තේමාව වූයේ මානව සංහතියේ තමනට ලබා දිය හැකි උපරිමය තම ළමයාට ලබා දීමට බැඳී සිටීම යි.

- පූර්ණ ළමා සංවර්ධනයක් ඇති කිරීම.

- සෞඛ්‍ය පුහුණු සහ විශේෂඥ සේවා සහ පෝෂ්‍ය ආහාර සඳහා ආධාර සැපයීම.

### යුනිසෙෆ් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග

☆ ළදරු සෞඛ්‍ය වර්ධනය කර ගැනීම සඳහා ආධාර කිරීම.

☆ ළමා රෝග මර්දනය කිරීම සඳහා කටයුතු කිරීම.

☆ සාක්ෂරතාව වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.

☆ ළදරු මරණ අනුපාතය අඩු කිරීම සඳහා කටයුතු කිරීම.

☆ ගම්බද සහ වතුකරයේ ළදරු සෞඛ්‍ය ආරක්ෂා කිරීම සහ ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය සඳහා ආධාර කිරීම.

☆ කඩිනම් මහවැලි යෝජනා ක්‍රමයෙන් නව ජනපදවල පවුල් සෞඛ්‍යය ආරක්ෂා කිරීමට ආධාර කිරීම.

☆ මන්දපෝෂණය දුරලීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

☆ ළමා අපචාර පිටුදැකීම සඳහා කටයුතු කිරීම.

## එක්සත් ජාතීන්ගේ වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ සම්මේලනය (UNCTAD)

**ආරම්භය**- 1964

**මූලස්ථානය**- ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර

### අරමුණු-

- ලෝක වෙළෙඳාම ආර්ථික සංවර්ධනය සඳහා බාධාවක් නොවන අන්දමින් පවත්වාගෙන යාම.
- සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජාත්‍යන්තර වෙළෙඳාම සංවර්ධනය කිරීම.
- සංවර්ධනය වන රටවල ආර්ථික සංවර්ධන වේගය වැඩි කිරීම සඳහා සහායවන ප්‍රතිපත්ති විශ්ලේෂණය.
- රාජ්‍යයන් සමඟ සාකච්ඡා සහ සම්මුති ඇති කිරීම.
- තාක්ෂණික සහයෝගීතාව ඇති කිරීම.

## ◈ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග

- ☆ වෙළෙඳ කටයුතු සංවිධානය කර ගැනීම සඳහා සහාය දීම.
- ☆ 1994 ජනවාරි සිට කොළඹ වරායේ ආනයන නිෂ්කාශන ක්‍රම පරිගණකගත කිරීම.
- ☆ ස්වයංක්‍රීය රේගු දත්ත ක්‍රමයට කටුනායක ගුවන් තොටුපළ ඇතුළත් කිරීම.
- ☆ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අංශය පරිගණකගත කිරීම.
- ☆ සංවර්ධනය වෙමින් පවතින රටවලට ණය සහන ලබා දීම.

# අන්තර් ජාතික ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුව (IBRD)

**ආරම්භය**- 1945
**මූලස්ථානය**- ඇමෙරිකාවේ බ්‍රෙට්න්වුඩ් හි පිහිටුවා ඇත.

මෙම ආයතනය ලෝක බැංකුව නමින් ද හැඳින්වේ. ජාත්‍යන්තර සංවර්ධන සංගමය, ජාත්‍යන්තර මූල්‍ය සමායතනය, බහු පාර්ශ්වික ආයෝජන සුරැකුම් ආයතනය, ජාත්‍යන්තර ආයෝජන ආරවුල් සමථ මණ්ඩලය යන ආයතනයන්ගෙන් මෙය සමන්විත වේ. සාමාජික සංඛ්‍යාව 175 කට අධික ය.

### අරමුණු-

දිළිඳුකම තුරන් කිරීම, දිළිඳු රටවල ආර්ථිකය ශක්තිමත් කිරීම, ආර්ථික සංවර්ධනය තුළින් එම රටවල ජනතාවගේ ජීවන තත්ත්වය යහපත් කිරීම ලෝක බැංකුවේ මූලික අරමුණු වේ.

- ◈ ලෝක බැංකුව ප්‍රධාන කාර්යයන් තුනක් ඉටු කරයි.
    - ☆ ණය මුදල් සැපයීම
    - ☆ ධරණීය සංවර්ධනයක් සඳහා ආර්ථික උපදෙස් හා තාක්ෂණික ආධාර සැපයීම.

- ☆ සංවර්ධනය වන රටවල අයෝජනය සඳහා අන්‍යයන්ට මඟ පෙන්වන ආයතනයක් සේ ක්‍රියා කිරීම.

- ◈ ලෝක බැංකුව මඟින් සපයන ලද ණය මුදල් යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන යෝජනා ක්‍රම කිහිපයකි.
  - ☆ කොළඹ සංවර්ධන යෝජනා ක්‍රමය.
  - ☆ දිළිඳුකම පිටුදැකීමේ යෝජනා ක්‍රමය.
  - ☆ සාමාන්‍ය අධ්‍යාපන යෝජනා ක්‍රමය.
  - ☆ කොළඹ ප්‍රවාහන යෝජනා ක්‍රමය.
  - ☆ සෞඛ්‍ය හා ජනගහන යෝජනා ක්‍රමය.
  - ☆ පෞද්ගලික මූල්‍ය සංවර්ධන යෝජනා ක්‍රමය.
  - ☆ ජාතික වාරිමාර්ග පුනරුත්ථාපන යෝජනා ක්‍රමය.
  - ☆ ආර්ථික ප්‍රතිව්‍යුහකරණ යෝජනා ක්‍රමය.
  - ☆ විදුලි සංදේශ යෝජනා ක්‍රමය.
  - ☆ විදුලි බල යෝජනා ක්‍රමය.

මේවාට අමතර ව ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කර ඇති ආකාරය දැකගත හැකි ය. මෙමගින් ශ්‍රී ලංකාවේ සංවර්ධන කාර්යයට ලෝක බැංකුව දායක වී ඇත.

## ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)

**ආරම්භය**- 1948

**මූලස්ථානය**- ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර.

සාමාජික රටවල ආර්ථික හා සමාජ සංවර්ධනයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකා සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූලික පරමාර්ථය වේ.

## අරමුණු- ආදර්ශ පාඨයः-

**"රෝග බෝවී රෝගවලට ප්‍රතිකාර කිරීම නොව රෝග නිවාරණය"**

- සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව සඳහා මඟ පෙන්වීම.
- ජාතික සෞඛ්‍ය වැඩසටහන් සැලසුම්කරණය, පරිපාලනය, ශක්තිමත් කිරීම සඳහා ඒ ඒ රාජ්‍යන්ට සහාය වීම.
- සෞඛ්‍ය හා සම්බන්ධ තොරතුරු හා තාක්ෂණික උපකරණ හුවමාරු කර ගැනීම.

◈ **1978 රුසියාවේ අල්මා අටා නගරයේ දී ප්‍රාථමික සෞඛ්‍ය සම්මේලනයේ දී කරුණු අටක වැඩසටහනක් කෙරෙහි අවධානය යොමුකරන ලදී.**

- ☆ සෞඛ්‍ය අධ්‍යාපනය, ආහාර හා පෝෂණය, පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව, ළමා සෞඛ්‍ය හා පවුල් සැලසුම, මාතෘ සෞඛ්‍ය සංරක්ෂණය, වසංගත රෝග වැළැක්වීම, රෝගවලට ප්‍රතිකාර කිරීම, ඖෂධ වර්ග සැපයීම ඒ අතර වේ. මෙම වැඩසටහනේ දී සංවර්ධනය වන රටවල් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරිණි.
- ☆ ලෝක සෞඛ්‍ය සංවිධානය මුහුණ පා ඇති නවතම අභියෝගය වන්නේ ඒඩ්ස් රෝගය මර්දනය සම්බන්ධ කටයුතු කිරීම යි.
- ☆ ඩිප්තීරියා, සරම්ප, පෝලියෝ, පිටගැස්ම, කක්කල් කැස්ස, ක්ෂය රෝගය වැනි රෝගවලින් ළමා පරපුර බේරා ගැනීම සඳහා ලෝක ව්‍යාප්ත වැඩසටහන් දැනට ක්‍රියාත්මක කෙරේ.

◈ **ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග**

ඉහත වැඩසටහන්වල ප්‍රතිඵල ශ්‍රී ලංකාවට ද ලබාගත හැකි වූ අතර පහත ක්‍රියාමාර්ග ද ගෙන ඇත.

- ☆ සෞඛ්‍ය සේවාව සඳහා මානව සම්පත් සංවර්ධනය.
- ☆ සෞඛ්‍ය පර්යේෂණ සංවර්ධනය.
- ☆ සෞඛ්‍ය විෂයයන් පිළිබඳ තොරතුරු සම්පාදනය හා අධ්‍යාපනය.

☆ මව්වරුන්, ළමුන්, කම්කරුවන්, වයෝවෘද්ධ ජනයා වැනි විශේෂ කණ්ඩායම්වල සෞඛ්‍ය ආරක්‍ෂාව හා ප්‍රවර්ධනය.

☆ මානසික සෞඛ්‍ය ආරක්‍ෂාව හා ප්‍රවර්ධනය.

☆ ආහාර සුරක්‍ෂිතභාවය.

- සංක්‍රමණික රෝග නිවාරණය හා මර්දනය.
- සාමාන්‍ය සෞඛ්‍ය රැකවරණය හා ප්‍රවර්ධනය.

මෙම වැඩ සටහන් මඟින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමට කටයුතුකර ඇත.

## ලෝක කම්කරු සංවිධානය (ILO)

**ආරම්භය-** 1919 දී ආරම්භ වූ අතර එක්සත් ජාතීන්ගේ අනුබද්ධ සංවිධානයක් බවට පත්වූයේ 1946 දී ය.

**මූලස්ථානය-** ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර.

### අරමුණු-

☆ කම්කරු අයිතීන් ආරක්‍ෂා කිරීම.

☆ සාමාජික රාජ්‍යන්හි කම්කරුවන්ගේ සේවා තත්ත්වය උසස් කිරීම.

☆ ලොව පුරා වැඩකරන ජනතාවගේ වැඩ හා නිවාසවල තත්ත්වය උසස් කිරීම.

☆ කම්කරුවන්ගේ දියුණුව සඳහා වැඩසටහන් පිළියෙල කිරීම.

☆ තාක්‍ෂණික සහය සඳහා උචිත වැඩසටහන් පිළියෙල කිරීම.

☆ වැඩකරන ජනතාවගේ අධ්‍යාපනික කටයුතු සහ අභ්‍යාස වැඩසටහන් සකස් කිරීම.

☆ කම්කරුවන්ගේ රැස්වීමේ නිදහස, වැටුප්, වැඩකරන පැය ගණන, කම්කරු වන්දි, සේවා කොන්දේසි, සමාජ රක්ෂණ, නිවාඩු, ආරක්ෂාව වැනි කරුණු පිළිබඳ කිසියම් සමානාත්මතාවක් ඇති කිරීම.

## ◈ ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්

☆ අප්‍රිකාවේ කැරීබියානු කලාපයේ කම්කරු සබඳතා වැඩි දියුණු කිරීම හා කම්කරු සමාජ සුරක්ෂිතතාව සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

☆ ආසියාවේ මිනිස්බල සැලසුම් පිළිබඳ ව ආසියානු වැඩසටහන් මඟින් කම්කරු ගැටලු නිරාකරණය කිරීමට කටයුතු කිරීම.

☆ කම්කරු පරිපාලනය, කම්කරු සබඳතා, සමාජ රක්ෂණය, රැකියා ප්‍රතිපත්ති, වෘත්තීය ආරක්ෂාව, කම්කරු අනතුරු, වනිතාවන් හා ළමුන් සේවයේ යෙදීම වැනි අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම.

☆ තාක්ෂණික සහාය සඳහා පුහුණු වැඩසටහන්, අධ්‍යාපනය, පර්යේෂණය සහ තොරතුරු සම්පාදනය.

☆ ළමා ශ්‍රමය පිටුදැකීම සඳහා ජාත්‍යන්තර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## ◈ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග.

☆ මැද පෙරදිග රැකියා සඳහා ගිය ශ්‍රී ලාංකික කම්කරුවන් ආපසු පැමිණි විට පුනරුත්ථාපනය කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

☆ හෝටල් සහ සංචාරක කර්මාන්ත පුහුණුව හස්ත කර්මාන්ත අංශයන්හි වර්ධනය සඳහා ශ්‍රී ලංකා මෝස්තර මධ්‍යස්ථානයට ආධාර කිරීම.

☆ විදේශ රැකියා වැඩි වැඩියෙන් සපයා ගැනීම සඳහා ශ්‍රී ලංකාවට සහාය වී ඇත.

**ක්‍රියාකාරකම් - 5.3**

1. එක්සත් ජාතීන් ලෝක සාමය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවා ද යි පහදන්න.

## ප්‍රාදේශීය සංවිධාන (කලාපීය සංවිධාන)

### හැඳින්වීම

ලෝකයේ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සංවිධාන දෙස බලන විට දැකගත හැකි විශේෂ ජාත්‍යන්තර සංවිධාන වර්ගයක් ලෙස ප්‍රාදේශීය සංවිධාන හඳුනාගත හැකි ය. මේවා රාජ්‍ය මට්ටමින් ඇති කරගන්නා ජාත්‍යන්තර සබඳතා නිරූපණය කරයි. මෙම සංවිධානය ප්‍රාදේශීය නැතිනම් කලාපීය සංවිධාන ලෙස හඳුන්වන්නේ භූගෝලීය කලාපයක් නියෝජනය කරන හෙයිනි. භූගෝලීය වශයෙන් වෙන් කොට ගත හැකි ලෙස රාජ්‍ය සීමාවන් යොදා ගෙන ඇත. නිදසුන් ලෙස යුරෝපා, ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු ලෙස කලාප වෙන් වන්නේ මෙලෙසය. එහි උප බෙදීම් ලෙස කළු අප්‍රිකාව, පැසිපික් කලාපය, කැරිබියානු ප්‍රදේශය, මැද පෙරදිග, දකුණු ආසියාව වශයෙන් හඳුනාගෙන ඇත. මේවා භූගෝලීය සීමාවන් වශයෙන් ම නොව භූගෝලීය කලාප වශයෙන් ද හැඳින්වේ. කිසියම් භූගෝලීය කලාපයක් තුළ උප කලාපයන්ද දක්නට ලැබේ. මෙවැනි උප කලාප තුළ ද කලාපීය සංවිධාන යනුවෙන් හඳුන්වන සංවිධාන දැකගත හැකිය. ඒවා හඳුන්වන්නේ උප කලාපීය සංවිධාන ලෙස නොව කලාපීය සංවිධාන ලෙස ම ය. නිදසුනක් ලෙස සාර්ක් සංවිධානය දැක්විය හැකි ය.

### කලාපීය යුධ සංවිධාන

දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝක බලවතුන් කඳවුරු දෙකකට බෙදූ බටහිර බලවතා වූ ඇමෙරිකාවත් නැගෙනහිර බලවතා වූ සෝවියට් දේශයත් ප්‍රමුඛ බටහිර හා නැගෙනහිර යුරෝපා ජාතීන් ලෙස එම කඳවුරු දෙක හැඳින්වේ.

ප්‍රථම කලාපීය සංවිධානය වන්නේ උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය හෙවත් ORTH TLANTIC REATY RGANIZATION නේටෝ සංවිධානය යි එම සංවිධානය

පිහිටුවීමට ප්‍රධාන හේතුව වූයේ බටහිර යුරෝපා රටවල සාමූහික ආරක්ෂාව පිළිබඳ ව එම සංවිධානයේ සාමාජික රාජ්‍යයන් අතර ඇතිකර ගත් එකඟතාවය යි. පොදු එකඟතාවයක් හා පොදු පරමාර්ථ අනුව රාජ්‍යයන් කිහිපයක් එකතුවීමත් එම රාජ්‍යයන් එක ම භූගෝලීය කලාපයක පිහිටීමත් කලාපීය සංවිධානයක දැකිය හැකි වැදගත් ලක්ෂණයක් වේ. ඒ අනුව ඇමරිකාව, බ්‍රිතාන්‍ය, ප්‍රංශය, ඉතාලිය, කැනඩාව, නොර්වේ, බෙල්ජියම, ඩෙන්මාර්ක්, නෙදර්ලන්තය, ලක්සම්බර්ග්, පෘතුගාලය සහ අයිස්ලන්තය යන රටවල් නේටෝවට අයත් විය. පසු ව ග්‍රීසිය සහ තුර්කියත් බටහිර ජර්මනියත් එකතු විය.

මෙයට සමාන ව නැගෙනහිර යුරෝපා රටවල් නැතිනම් සෝවියට් දේශය ප්‍රමුඛ කොමියුනිස්ට්වාදී රටවල් තම ආරක්ෂාව සඳහා වෝර්සෝ ගිවිසුම් සංවිධානය (Warsaw Treaty Organization) නමින් සංවිධානයක් ඇති කර ගන්නා ලදී. මෙය ඇතිවීමට මූලික හේතුව බටහිර ජර්මනිය නේටෝ සාමාජිකත්වය ලැබීමෙන් පසු ව නැවත වරක් බටහිර යුරෝපා රටවල් විසින් සෝවියට් දේශය ආක්‍රමණය කරනු ඇතැයි යන භීතිය යි. මෙම වෝර්සෝ සංවිධානයට සෝවියට් රුසියාව, බල්ගේරියාව, හංගේරියාව, රුමේනියාව, චෙකොස්ලෝවැසියාව, සහ පෝලන්තය ඇතුළත් විය. වෝර්සෝ සංවිධානය යුරෝපා භූගෝලීය කලාපයේ ඇති වූ දෙවන යුධමය සංවිධානය යි. දැනට ක්‍රියාත්මක ව පවතින්නේ නේටෝ ව පමණි.

## කලාපීය ආර්ථික සංවිධාන

ආර්ථික සංවර්ධනය පදනම් කරගත් කලාපීය සංවිධාන බිහිවීම ආරම්භ වූයේ බටහිර යුරෝපයෙනි. 1957 දී ඇති කරන ලද යුරෝපා ආර්ථික ප්‍රජාව (European Economic Community) ආරම්භක සංවිධානය විය. දෙවන ලෝක යුද්ධයෙන් බිඳවැටුණු යුරෝපා රටවල ආර්ථික යළි ගොඩනැංවීමට ඇමෙරිකාව විසින් දියත් කළ 'මාර්ෂල්' සැලැසුමට අමතර ව කලාපීය රටවල වෙළෙඳාම දියුණු කිරීමේ අරමුණින් යුරෝපා ගල් අඟුරු හා වානේ ප්‍රජාව (European Coal and Steel Community) නමින් කලාපීය සංවිධානයක් 1952 දී ඇති කරගන්නා ලදී. මෙයට අමතර ව යුරෝපානු පරමාණු බල ඒකාධිකාරය (European Atomic Energy Community) නමින් තවත් සංවිධානයක් බිහිවිය. මේ සංවිධාන දෙකේ ම සාමාජිකයන් වූයේ ප්‍රංශය, බටහිර ජර්මනිය, ඉතාලිය, බෙල්ජියම, නෙදර්ලන්තය සහ ලක්සම්බර්ග්ය යි. ඉහත සංවිධාන විසින් ලබා ගත් සාර්ථකත්වය සහ කලාපීය සහයෝගීතාව තව දුරටත් වර්ධනය කිරීම අරමුණෙන් 1957 දී "යුරෝපා හවුල" බිහි කර ගන්නා ලදී. මෙම සංවිධානය අද වනවිට මුළු යුරෝපය ම ඒකරාශී කරන ප්‍රධාන බලවේගය බවට පත් ව තිබේ.

ලතින් ඇමරිකාව, අප්‍රිකාව සහ ආසියාතික කලාපයේ රටවල ද විවිධ කලාපීය සංවිධාන බිහි විය. එවැනි සංවිධානවල ප්‍රධාන පරමාර්ථය වූයේ කලාපීය රටවල් අතර ආර්ථික සංවර්ධනයක් ලබා ගැනීම යි. ලතින් ඇමරිකානු නිදහස් වෙළෙඳ සංගමය □□ATIN □MERICAN □REE □RADE □SSOCIATION□ එවැන්නකි. මෙය 1980 න් පසු ව ලතින් ඇමරිකානු ඒකාග්‍රතා සංවිධානය □□ATIN □MERICAN □REE □RADE □SSOCIATION□ යනුවෙන් හැඳින්විණි. අප්‍රිකානු කලාපයේ ද එවැනි සංවිධාන රාශියක් බිහි වූ අතර අප්‍රිකානු සංවිධාන □□FRICAN □NITY□ ඒවා අතුරින් සාර්ථකත්වයට පත් සංවිධානයක් ලෙස හැඳින්විය හැකි ය. මෙම සංවිධානය දේශපාලන පරමාර්ථ පෙරදැරි කරගෙන 1963 දී පිහිට වූව ද ආර්ථික සම්පත් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ද වැදගත් වේ.


ආසියාතික රටවල ද මෙවැනි සංවිධාන බිහි වූ අතර වඩාත් සාර්ථකත්වයක් ලබා ගැනීමට "ආසියාන්" □□SSOCIATION □F □OUTH □AST □SIAN □ATIONS□ සංවිධානය සමත් විය. 1967 දී පිහිටුවන ලද මෙම සංවිධානයට තායිලන්තය, මැලේසියාව, ඉන්දුනීසියාව, පිලිපීනය, සිංගප්පූරුව සහ පසුව 1982 දී බෲනායි රාජ්‍යය ද අයත් විය. කලාපීය සාමය හා ස්ථාවරත්වය පවත්වා ගැනීම එහි මූලික පරමාර්ථය වූ අතර පසු ව ආර්ථික සහයෝගීතාවය උදෙසා අවධානය යොමු විය. 1987 න් පසු ව ආසියාන් සංවිධානයට අයත් රටවල් විසින් "ආසියා හා ශාන්තිකර කලාපීය ආර්ථික සහයෝගීතා සංවිධානය □□SIA □ACIFIC □CONOMIC □O□OPERTION □ORUM□" නමින් සංවිධානයක් පිහිටුවා ගන්නා ලදී. එයට ඕස්ට්‍රේලියාව, කැනඩාව, ජපානය, නවසීලන්තය, දකුණු කොරියාව සහ ඇමෙරිකාව ද ඇතුළත් කරගන්නා ලදී. මෙම සංවිධානය ආසියා පැසිපික් කලාපයේ ආර්ථික සහයෝගිතාවය උදෙසා ම පිහිටුවා ගන්නා ලද්දකි.

කලාපීය සංවිධාන ආර්ථික, සාමය හා සුරක්ෂිතතාවය පදනම් කරගෙන බිහිවීමේ ප්‍රවණතාවක් තිබුණ ද දකුණු ආසියාව මේ සඳහා යොමුවන්නේ 1985 දීය. එනම් දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංවිධානය □□OUTH □SIAN □SSOCIATION □OR □EGIONAL □O□OPERATION□ පිහිටුවා ගැනීමෙනි. මෙය සාර්ක් □□□□□□□ යනුවෙන් ද භාවිත කෙරේ.

## සාර්ක් සංවිධානය

සාර්ක් සංවිධානයේ සමාජිකත්වය දරන්නේ දකුණු ආසියාව නම් වූ භූගෝලීය උප කලාපයට අයත් ඉන්දියාව, පාකිස්ථානය, බංගලිදේශය, ශ්‍රී ලංකාව, භූතානය, මාලදිවයින, නේපාලය සහ ඇෆ්ගනිස්ථානය යන රටවල් අට යි. 2007 අප්‍රේල් මාසයේ සිට ඇෆ්ගනිස්ථානය නිල වශයෙන් සාර්ක් සංවිධානයට ඇතුළත් වූ නව සාමාජිකයා ලෙස හැඳින්විය හැකි ය. (සිතියම් අංක 5.1).

### සාක් රටවල්




**සිතියම් අංක 5.1**

## සාර්ක් සංවිධානයේ අරමුණු

1. දකුණු ආසියාතික ජනතාවගේ සුභ සිද්ධිය හා තත්ත්වය නංවාලීම.
2. කලාපීය ආර්ථික වර්ධනය, සමාජයීය ප්‍රගතිය හා සංස්කෘතික සංවර්ධනය කඩිනම් කිරීම සහ සියලු ම පුද්ගලයන්ට ආත්ම ගරුත්වයෙන් යුතු ව ජීවත් වීමේ හා ඔවුන්ගේ පූර්ණ හැකියාවන් අවබෝධ කරගැනීමේ ඉඩ ප්‍රස්තා සැලසීම.
3. දකුණු ආසියාතික රටවල් අතර සාමූහික විශ්වාසය ප්‍රවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම.
4. අන්‍යෝන්‍ය අවබෝධය සහ විශ්වාසය කලාපය තුළ ඇති කිරීමෙන් එකිනෙකාගේ ප්‍රශ්න අවබෝධ කර ගැනීම.
5. ආර්ථික, සමාජයීය, සංස්කෘතික, තාක්ෂණික හා විද්‍යාත්මක ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරී සහයෝගය සහ අන්‍යෝන්‍ය ආධාර ප්‍රවර්ධනය කිරීම.
6. සෙසු සංවර්ධනය වන රටවල් සමඟ පවතින සහයෝගය ශක්තිමත් කිරීම.
7. පොදු ප්‍රශ්නවල දී ජාත්‍යන්තර වශයෙන් කලාපීය පදනමක් යටතේ පෙනී සිටීම.
8. එක සමාන ඉලක්ක හා අරමුණු සහිත ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන සමඟ කටයුතු කිරීම.

## සාර්ක් රටවල රාජ්‍ය නායකයන් (2007)



### සාර්ක් සංවිධානයේ ප්‍රධාන ආයතන

- රාජ්‍ය නායක සමුළුව
- විදේශ අමාත්‍ය මණ්ඩලය
- විදේශ ලේකම්වරුන්ගෙන් සමන්විත ස්ථාවර කමිටුව
- තාක්ෂණික කමිටුව
- මහ ලේකම් කාර්යාලය

රාජ්‍ය නායක සමුළුව වාර්ෂික ව පැවැත්විය යුතු ය. මෙහි දී විදේශ අමාත්‍ය මණ්ඩලය විසින් නිර්දේශ කර ඉදිරිපත් කරනු ලබන වැදගත් කරුණු සම්බන්ධයෙන් තීරණ ගනියි.

## සාර්ක් සංවිධානයට අයත් රටවල ජාතික කොඩි




සෑම කලාපීය සංවිධානයක් සඳහා ම සංකේතයක් භාවිත කරන අතර සාර්ක් සංවිධානය සංකේතවත් කිරීම සඳහා පහත ලාංඡනය භාවිත කරයි.

## සාක් සංවිධානයේ ලාංඡනය

සාර්ක් සංවිධානය බිහි වන්නේ 1985 දෙසැම්බර් 08 වන දින දකුණු ආසියානු කලාපීය

රටවල රාජ්‍ය නායකයින් විසින් සාර්ක් ප්‍රඥප්තිය අත්සන් කර ප්‍රකාශයට පත් කිරීමත් සමග ය. බංග්ලාදේශයේ ජනාධිපති ව සිටි සියා උර් රහමන් මෙහි නිර්මාතෘවරයා ය. දකුණු ආසියාව සඳහා කලාපීය සංවිධානයක් ඇති කිරීමේ අවශ්‍යතාව ඔහු දිගින් දිගට ම අවධාරණය කළ අතර එහි අවසාන ප්‍රතිඵලය වූයේ සාර්ක් සංවිධානය බිහි වීම යි.

## සාර්ක් අධිකාර පත්‍රය හෙවත් ප්‍රඥප්තියට අත්සන් කළ රාජ්‍ය නායකයෝ

| රාජ්‍යය | රාජ්‍ය නායකයා |
|---|---|
| ශ්‍රී ලංකාව | ජනාධිපති ජුනියස් රිචඩ් ජයවර්ධන මැතිතුමා |
| ඉන්දියාව | අගමැති රජීව් ගාන්ධි මැතිතුමා |
| නේපාලය | නේපාල රජු බිරේන්ද්‍ර බීර් බික්රම් ෂාදේව් මැතිතුමා |
| පාකිස්ථානය | ජනාධිපති සියා උල් හක් මැතිතුමා |
| මාලදිවයින | ජනාධිපති මයුම් අබ්දුල් ගයුම් මැතිතුමා |
| බංග්ලාදේශය | ජනාධිපති හුසේන් මොහොමඩ් එර්ෂාඩ් මැතිතුමා |
| භූතානය | භූතාන රජු ජිග්මේ සින්ග්යා වැන්චුක් මැතිතුමා |

## සාර්ක් සංවිධානය තම රටවල දිළිඳුකම පිටු දැකීම සඳහා අනුගමනය කරන ක්‍රියා මාර්ග

- කෘෂිකාර්මික සංවර්ධනය
- අධ්‍යාපනික සංස්කෘතික හා ක්‍රීඩා සංවර්ධනය
- සෞඛ්‍ය ජනගහනය හා ළමා සුබසාධනය ඇති කිරීම
- විද්‍යා හා තාක්ෂණික දියුණුව සඳහා කටයුතු කිරීම
- ප්‍රවාහන අංශය දියුණු කිරීම
- කලාපීය රටවල වෙළෙඳාම දියුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

- තාක්ෂණික දැනුම හුවමාරුකර ගැනීම
- පරිසර සංවර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- ග්‍රාමීය සංවර්ධන කටයුතු වේගවත් කිරීම
- සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම
- සාමාජික රටවල පවතින ආපද අවස්ථාවල දී ප්‍රයෝජනයට ගැනීම සඳහා ආහාර සංචිතයක් පවත්වාගෙන යාම

ඉහත ක්‍රියා මාර්ගවලට අමතර ව විශේෂයෙන් කලාපයේ වෙළෙඳාම දියුණු කිරීම හා ආර්ථික සහයෝගිතාව වර්ධනය කිරීම සඳහා සප්තා (SAPTA) හා සෆ්ටා (SAFTA) යනුවෙන් ගිවිසුම් දෙකක් ඇති කර ගෙන ඇත.

## සප්තා - □□□□□□□□

සප්තා යනුවෙන් හඳුන්වන්නේ දකුණු ආසියානු කලාපීය වරණාත්මක වෙළෙඳ ගිවිසුමයි □□OUTH □SIAN □REFERENTIAL □RADE □GREEMENT□

- ☆ සප්තා වැඩපිළිවෙළ පිළිබඳ යෝජනාව 1991 දී ශ්‍රී ලංකාවේ පැවැති සාර්ක් රාජ්‍ය නායක සමුළුවට ඉදිරිපත් කළේ ශ්‍රී ලංකාව විසිනි. දකුණු ආසියාතික රටවල ආර්ථික සහයෝගිතාව වඩාත් ඵලදයි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නම් කලාපයේ රටවල් අතර සිදුවන වෙළෙඳම වර්ධනය කළ යුතු බවත් එසේ කළ හැක්කේ කලාපය තුළ සිදු කෙරෙන වෙළෙඳ ගනුදෙනුවල දී දේශීය නිෂ්පාදනයන්ට පහර නොවදින ආකාරයට තීරු ගාස්තු, රේගු හා වෙනත් ගාස්තු අඩු කිරීමෙන් බව සාකච්ඡා විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1993 අප්‍රේල් මාසයේ ඩකා හි දී පැවැත් වූ හත්වන රාජ්‍ය නායක සමුළුවේ දී සාර්ක් වරණාත්මක වෙළෙඳ ගිවිසුම අත්සන් කරන ලදී. 1995 දෙසැම්බර් 7 ද සිට මෙම ගිවිසුම ක්‍රියාත්මක විය.

ඒ අනුව කලාපයේ නිෂ්පාදනය වන භාණ්ඩ 226 ක් සම්බන්ධයෙන් තීරු ගාස්තු සහන සලසා ඇත. 1996 වන විට තීරු ගාස්තු සහනය හිමි භාණ්ඩ 1871 දක්වා ඉහළ නංවන ලදී. සාක් රටවල් අතරින් වැඩි ම තීරු ගාස්තු සහන ලබා දෙන ලද්දේ ඉන්දියාව විසිනි.

## සෆ්තා

මෙය සප්තා ගිවිසුමේ ඉදිරි පියවරක් ලෙස හැඳින්විය හැකි ය. කලාපීය රටවල් අතර නිදහස් වෙළෙඳ කලාපයක් ඇති කිරීමේ අරමුණින් මෙය අත්සන් කරන ලදී. දකුණු ආසියානු කලාපීය නිදහස් වෙළෙඳ ගිවිසුම (South Asian Free Trade Agreement) යනුවෙන් මෙය හැඳින් වේ.

දකුණු ආසියාව තුළ නිදහස් වෙළෙඳ කලාපයක් බිහි කිරීමෙන් මෙම රටවල් අතර ආර්ථික සහයෝගිතාව තර කිරීමටත්, එක් එක් රටවල දේශීය ආර්ථිකයේ වර්ධනය වේගවත් කිරීම හා නිෂ්පාදන ක්‍රියාවලියේ වේගය වැඩි කිරීමටත් අපේක්ෂා කෙරේ. මෙයට අමතර ව ශ්‍රම වෙළෙඳපළ සංචල කිරීමටත්, තරඟකාරීත්වය තුළින් වඩාත් ඉහළ මට්ටමේ නිමි භාණ්ඩ නිෂ්පාදනයටත් බලාපොරොත්තු වේ.

### ◈ සාර්ක් රටවල් ජාත්‍යන්තර සංවිධාන හා කලාපීය සංවිධාන සමඟ ඇතිකරගෙන ඇති සබඳතා

සාර්ක් රටවල් ජාත්‍යන්තර සහ කලාපීය සංවිධාන අතර සබඳතා ගොඩනගා ගෙන ඇත. එම සබඳතා කලාපීය සහයෝගීතාව උදෙසාත් ජාත්‍යන්තර සහයෝගිතාව උදෙසාත් බෙහෙවින් වැදගත් වේ. පහත සඳහන් සබඳතා උදාහරණ ලෙස දැක්විය හැකි ය.

1. සාර්ක් උන්ක්ටාඩ් 1993
2. සාර්ක් එස්කැප් 1994
3. සාර්ක් යුනිසෙප් 1993
4. සාර්ක් ආසියා පැසිපික් විදුලි සංදේශ 1994
5. සාර්ක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල
6. සාර්ක් එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ඖෂධ පාලනය කිරීමේ වැඩසටහන
7. සාර්ක් කොළඹ ක්‍රමය

**ක්‍රියාකාරකම් - 5.4**

1. "සාර්ක් සංවිධානය කලාපීය ආර්ථිකය නංවාලීමට සිදුකර ඇති මෙහෙය" නමින් පංති සඟරාවට ලිපියක් සකස් කරන්න.

2. සාර්ක් සංවිධානයට ජාත්‍යන්තර සංවිධාන අතර පවත්නා ස්ථානය පහදන්න.

## ජාත්‍යන්තර සබඳතා මාධ්‍ය

### තානාපති සේවය

ජාත්‍යන්තර සබඳතා වර්ධනය කිරීම හා ජාත්‍යන්තර සබඳතා කළමනාකරණය කිරීම සඳහා වැදගත්වන අංශයක් ලෙස තානාපති සේවය හැඳින්විය හැකි ය. රාජ්‍යයන් අතර සාමකාමී සබඳතා පවත්වාගෙන යාම සඳහා මෙය අවශ්‍ය වේ. එසේ ම රටක විදේශ ප්‍රතිපත්තිය මගින් ජාත්‍යන්තර අරමුණු ඉටු කර ගැනීමට යොදා ගන්නා සාමකාමී ක්‍රම වේදය ලෙස ද මෙය විස්තර කෙරේ.

බුද්ධිය හා උපාය උපක්‍රම යොදා ගනිමින් ස්වාධීන රාජ්‍යයන් අතර නිල සබඳතා පවත්වාගෙන යාම මෙමගින් අපේක්ෂා කෙරේ.

මේ අනුව රාජ්‍යයන් ජාත්‍යන්තර ප්‍රජාව සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාමේ උපක්‍රමයක් ලෙස තානාපති සේවය හැඳින්විය හැකි ය. රාජ්‍යයක් තවත් රාජ්‍යයක් සමඟ මූලික සබඳතා ඇති කර ගන්නේ, තානාපතිවරු හා රාජ දූතයන් හරහා ය. පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල තානාපතිවරුන් සඳහා මහ කොමසාරිස් යන නාමය භාවිත කරයි.

## ◈ තානාපතිවරුන්ගේ හා රාජ්‍ය දූතයන්ගේ කාර්යභාරය

1. තම රටේ ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීම.
2. තම රටේ පුරවැසියන්ගේ අභිලාශයන් ආරක්ෂා කිරීම.
3. තම රට මඟින් දැනුම් දෙන වැදගත් පණිවිඩ ලබා දීම.
4. තම රටේ ප්‍රතිපත්ති අවබෝධකර ගැනීම.
5. තම රට පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ඇති කිරීම.
6. රාජ්‍යයන් දෙක අතර මිත්‍රත්වය තහවුරු කිරීම.
7. දේශපාලන, සමාජ, ආර්ථික හා බුද්ධිමය සබඳතා වර්ධනය කිරීම.
8. තම රට නියෝජනය කිරීම මෙන් ම තම රටේ රාජ්‍ය නායකයා නියෝජනය කිරීම.
9. ඉහත කාර්යයන් පිළිබඳ මනා අවබෝධයෙන් හා සුපරික්ෂාකාරී ව ක්‍රියා කිරීම.

## ◈ තානාපතිවරුන්ගේ හා රාජ්‍ය දූතයන් තුළ තිබිය යුතු ගුණාංග

1. තානාපතිවරු හා රාජ්‍ය දූතයන් තම වෘත්තියේ නිදහස, නීතිරීති, ක්‍රමෝපායයන්, න්‍යාය ධර්මයන් සහ ආචාර ධර්ම පිළිබඳ ව මනා අවබෝධයෙන් ක්‍රියා කළ යුතු ය.

2. තම රට පිළිබඳ ව පමණක් නොව තමා සේවය කරන රට පිළිබඳ ව මෙන් ම එදිනෙදා ලෝක දේශපාලනයේ සිදුවන සිදුවීම් පිළිබඳ ව මනා අවබෝධයක් තිබිය යුතු ය.

3. ඔවුන්ට රාජ්‍ය උපායාත්මක කලාව, බේරුම්කරණය (RBITRATION) සමගිකරණය (ONCILATION) හා සාමන්ත්‍රණය (EGOTIATION) පිළිබඳ ව මනා දැනුමක් තිබිය යුතු ය.

4. ජාත්‍යන්තර නීතිය හා ජාත්‍යන්තර දේශපාලනය තම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට සමත්විය යුතු ය.

## ජාත්‍යන්තර වෙළෙඳාම

ලොව කිසි ම රටකට තමන්ට අවශ්‍ය සියලු දේ නිපදවා ගත නො හැකි ය. එසේ නිපදවා ගත නොහැකි භාණ්ඩ වෙනත් රටවලින් ගෙන්වා ගනු ලැබේ. වෙනත් රටවල් අතර නිරතුරු ව ඇතිවන විවිධ ඉල්ලුම් සපුරාලීම නිසා ජාත්‍යන්තර වෙළෙඳාම බිහි වී ඇත. එක් රටක නිපදවන අතිරික්ත භාණ්ඩ, තවත් රටකට අපනයනය කෙරෙන අතර, එම රටට අවශ්‍ය දේ වෙනත් රටවලින් ආනයනය කරයි. මේ නිසා ලෝකයේ විවිධ ප්‍රදේශවල වගා කරන ආහාර හා පලතුරු වර්ග ද, නිෂ්පාදනය කරන රෙදිපිළි හා වෙනත් භාණ්ඩ වර්ග ද පරිභෝජනය කිරීමේ අවස්ථාව ජාත්‍යන්තර වෙළඳාම මඟින් ලැබී ඇත.

ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.

1. ද්වි පාර්ශ්වික වෙළෙඳාම
2. බහු පාර්ශ්වික වෙළෙඳාම

### ◈ ද්වි පාර්ශ්වික වෙළෙඳාම

රටවල් දෙකක් අතර කෙරෙන භාණ්ඩ හා සේවා හුවමාරු ව ද්විපාර්ශ්වික වෙළෙඳාම යනුවෙන් හැඳින්වේ. මේ සඳහා රටවල් දෙක අතර ලිඛිත ගිවිසුමක් ඇති කර ගත යුතු ය. හුවමාරු වන භාණ්ඩ වර්ග මුදල් ගනුදෙනු පියවා ගන්නා ආකාරය ආදිය පිළිබඳ විස්තර මෙම ගිවිසුමට ඇතුළත් විය යුතු ය. ගිවිසගත් භාණ්ඩයේ හෝ භාණ්ඩවල මිල ලෝක වෙළෙඳපොළෙහි වෙනස් වුව ද ගිවිසුමේ සඳහන් මිල ගණන් වෙනස් කළ නො හැකි ය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඇති වූ ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම සහ 1952 රබර් සහ සහල් ගිවිසුම (චීනය සහ ශ්‍රී ලංකාව) නිදසුන් වේ. විදේශ විනිමය පිළිබඳ ගැටලු ඇති රටවලට මේ ක්‍රමය වාසිදායක වේ.

### ◈ බහු පාර්ශ්වික වෙළෙඳාම

රටවල් දෙකකට වැඩි ගණනක් අතර කෙරෙන භාණ්ඩ හා සේවා හුවමාරුව බහු පාර්ශ්වික වෙළෙඳාම යනුවෙන් හැඳින්වේ. එය වර්තමාන ලෝකයේ ක්‍රියාත්මකවන වඩාත් ප්‍රචලිත වෙළෙඳ ක්‍රමය යි. මේ යටතේ ගනුදෙනු කරන රටවල් භාණ්ඩ සඳහා ගෙවිය යුතු හෝ ලබා ගත යුතු වත්කම් ප්‍රමාණය රටෙන් රටට සෘජු ව අයකර නො ගනී. එක් රටකින් ආනයනය කරන භාණ්ඩයේ වටිනාකම තවත් රටකට අපනයනය කරන භාණ්ඩයක වටිනාකමින් ගෙවීමට හැකි වීම මෙහි ඇති ප්‍රධාන ලක්ෂණයකි. නිදසුන්

ලෙස ශ්‍රී ලංකාව නවසීලන්තයෙන් ඇමෙරිකන් ඩොලර් දශ ලක්ෂයක් වටිනා කිරිපිටි තොගයක් ආනයනය කළේ යැයි සිතමු. ඒ සඳහා ගෙවීමට ඇති මුදලට සමාන සුළු අපනයන භෝග පකිස්ථානයට අපනයනය කළ හැකි ය. තව ද, ශ්‍රී ලංකාව ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයනය කරන ඇමෙරිකන් ඩොලර් දශලක්ෂයක් වටිනා නිමි ඇඳුම් තොගයක් සඳහා ඇමෙරිකාව ශ්‍රී ලංකාවට ගෙවිය යුතු මුදල නවසීලන්තයට ගෙවන ලෙස දැනුම් දීමට පුලුවන.

මෙහි දී නවසීලන්තයට ඇමෙරිකා එක්සත් ජනපදයෙන් එම මුදල හෝ එම වටිනාකමට සරිලන භාණ්ඩ හෝ ලබාගත හැකි වේ. භාණ්ඩ ලබා ගන්නේ නම් එම රටවල් අතර මුදල් හුවමාරුවක් සිදු නො වේ. භාණ්ඩ හුවමාරුවකින් ම ගනුදෙනු පියවාගත හැකි වේ. මෙලෙස රටවල් දෙකකට වැඩි ප්‍රමාණයක් සම්බන්ධ වී කෙරෙන වෙළෙඳාම බහු පාර්ශ්වික වෙළෙඳාම යනුවෙන් හැඳින්වේ.

ජාත්‍යන්තර වෙළඳාමේ දී වටිනාකම අනුව ලොව පිළිගත් මුදල් වර්ග ලෙස ඇමෙරිකන් ඩොලර්, බ්‍රිතාන්‍ය ස්ටර්ලිං පවුම්, යුරෝපා රටවල යූරෝ, ජපානයේ යෙන් වැනි මුදල් වර්ග දැක්විය හැකි ය.

ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනු ජාත්‍යන්තර සම්බන්ධතා ශක්තිමත් වීම සඳහා විවිධ අයුරින් දායක වේ.

## යුද්ධය

පාර්ශ්ව දෙකක් හෝ වැඩි ගණනක් අතර යම් ගැටලු සහගත තත්ත්වයකට සාමකාමී විසඳුම් සොයා ගැනීමට අපහසු වූ විට යුද්ධය ඇතිවිය හැකි ය.

රටවල් අතර හෝ එක ම ජාතියක විවිධ පාර්ශවයන් අතර සන්නද්ධ අරගල ඇති වීමේ හැකියාවක් ද පවතී.

## යුද්ධයට බලපාන හේතු සාධක

1. **දේශපාලන සාධක** යුද්ධය සඳහා බලපාන දේශපාලන හේතු සාධක පහත සඳහන් කරුණු එකක් හෝ කිහිපයක් මත පදනම් වේ.

   - ස්වාධිපත්‍යය
   - බල සමතුලිතතාව
   - ආරවුල්
   - අන්‍යෝන්‍ය අවිශ්වාසය හා සැකය
   - විදේශ බිය

2. **මනෝ විද්‍යාත්මක සාධක** මනුෂ්‍යයන් තුළ එකිනෙකා පිළිබඳ ව ඇතිවන බිය නිසා ඔහු විනාශ කිරීමේ මානසික තත්ත්වයන් වර්ධනය වීම තුළින් යුද්ධ ඇති වේ. එමගින් ඔවුහු එකිනෙකාට එරෙහි ව සටන් වදිති. නාසිවාදය හා පැසිස්ට්වාදය එයට කදිම නිදසුන් වේ. යුද්ධය සඳහා මිනිසුන් පෙළඹවීමට අවශ්‍ය මනෝමය පරිසරය සකස් කරන දෘෂ්ටිවාද දෙකක් ලෙස ඒවා හැඳින්විය හැකි ය.

3. **සංස්කෘතික සාධක** සංස්කෘතික සාධක ගණයට වැටෙන්නේ කුල/ භාෂා/ ආගමික/ ජන වාර්ගික යන සාධක යි.

4. **දෘෂ්ටිවාද සාධක** ජාත්‍යන්තර දේශපාලනය තුළ විවිධ දෘෂ්ටිවාද හේතු කොටගෙන යුද්ධ පැන නැගී ඇත.

5. **ආර්ථික සාධක** භාණ්ඩ හෝ සේවා බෙදා ගැනීම හෝ ලබා ගැනීම වැනි ආර්ථික සාධකය මුලික කරගෙන ඇති වන යුද්ධ මෙම ගණයට ගත හැකි ය.

ඉහත සඳහන් සාධක එකක් හෝ කිහිපයක් පදනම් කරගෙන යුද්ධ ඇති විය හැකි ය. 20 වැනි සියවසේ පමණක් යුද්ධය නිසා මිය ගිය සංඛ්‍යාව මිලියන 111 ක් ලෙස ගණන් බලා තිබේ. පළමු ලෝක යුද්ධ සමයේ දී සොල්දාදුවන් මිලියන 8.4 ක් මරණයට පත් වූහ. සාමාන්‍ය ජනතාව මිලියන 1.4 ක් මරණයට පත් වූහ. දෙවන ලෝක යුද්ධයේ දී මිය ගිය සොල්දාදුවන්ගේ සංඛ්‍යාව මිලියන 16.9 ක් වූ අතර සාමාන්‍ය ජනතාවගේ සංඛ්‍යාව මිලියන 34.3 කි. මෙකී ලෝක යුද්ධ දෙක පැවැති කාලය තුළ වසරකට මිය ගිය ගණන මිලියන 8.5 කි.

ලෝකයේ පැවති යුධ තත්ත්වයන් පිළිබඳ ව අවධානය යොමු කළ හිටපු ඇමරිකානු ජනාධිපතිවරයෙකු වූ ජෝන් එෆ්. කෙනඩි ප්‍රකාශ කළේ "එක්කෝ මානව සංහතිය යුද්ධය අවසන් කළ යුතු ය. නැතිනම් යුද්ධය මානව සංහතිය ම අවසන් කරාවි" යනුවෙනි.

යුධමය හේතු සාධක පදනම් කර ගෙන ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වාගෙන යැමේ දුෂ්කරතා ඇති වන ආකාරයක් ද දැකගත හැකි ය. එක් රටක යුධමය තත්ත්වයන් හේතුවෙන් තවත් රටක සරණාගතයන් වැඩි විය හැකි ය. අද වන විට සරණාගත ප්‍රශ්නය අතිශය ගැඹුරු තත්ත්වයකට පත්වී ඇත. මේ නිසා ජාත්‍යන්තර සහයෝගිතාවයෙන් එම ප්‍රශ්නය විසඳගත යුතු ව ඇත. යුධ වාතාවරණයක් තුළ සම්පත් බහුල ව විනාශ වේ. එම සම්පත් නැවත සකස්කර ගැනීමට ජාත්‍යන්තර සහයෝගිතාවය නැතිව ම බැරි ය. ආරක්ෂක තත්ත්වය දුර්වල වීම නිසා වෙනත් රාජ්‍යයන්ගේ උදව් උපකාර ලබා ගැනීමට සිදු වී ඇත. විශේෂයෙන් ම ත්‍රස්තවාදී ප්‍රශ්නය පවතින රටවල් වෙනත් රාජ්‍යයන්ගෙන් අවි ආයුධ වැනි යුද්ධෝපකරණ ලබා ගැනීමට, යුධ පුහුණු අවස්ථා ලබා ගැනීමට, යුද්ධයට අවශ්‍ය සොල්දාදුවන් ලබා ගැනීමට ප්‍රබල රාජ්‍යයන් සමඟ සම්බන්ධතා ඇතිකර ගනියි. මෙම සම්බන්ධතා බොහෝ දුරට ගිවිසුම් සහගත ඒවා වන අතර එමගින් අනිටු පලවිපාක ද පසු කාලීන ව උදාවිය හැකි ය. එසේම යුධ අනාථයන් යළි පදිංචි කිරීම, ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම, අධ්‍යාපනය, සෞඛ්‍යය හා ආරක්ෂාව වැනි පහසුකම් ලබා දීම රාජ්‍යයකට තනිව ම සිදු කළ නො හැකි ය. මේ සඳහා ද ජාත්‍යන්තර ප්‍රජාවගේ සහයෝගය අවශ්‍ය ය. මෙම වාතාවරණය පදනම් කරගෙන ද ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය කිරීමේ අවශ්‍යතාවක් ව පවතී.

## විදේශ ආධාර

විශේෂයෙන්ම සංවර්ධනය වන රටවලට විදේශ ආධාර අවශ්‍ය ය. සංවර්ධිත ජාත්‍යන්තර ප්‍රජාව මේ පිළිබඳ ව වැදගත් මෙහෙයයන් ඉටු කරමින් සිටි යි. මේ සඳහා ජාත්‍යන්තර වශයෙන් යහපත් සබඳතා පවත්වාගෙන යාම වැදගත් වේ. බොහෝ දුරට සංවර්ධනය වන රටවල් අපනයනය කරන්නේ ප්‍රාථමික භාණ්ඩ ය. ඒවාට ලෝක වෙළෙඳපොළේ දී ලැබෙන්නේ අඩු මිලකි. ඒ නිසා ම එම රටවල විදේශ ඉපැයීම් අඩු ය. ආහාර, ඇඳුම්, ඖෂධ වර්ග හා බොහෝ යන්ත්‍රෝපකරණ ආදිය සඳහා ඉහළ මිළක් ගෙවීමට සිදු වේ. ආනයන වියදම් වැඩි වීමත් අපනයන ආදායම අඩු වීමත් නිසා නිරතුරු ව ම අවාසිදායක වෙළෙඳ ශේෂයකට සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දීමෙන් රටේ ප්‍රාග්ධන

සම්පාදනය පහළ වැටේ. එවිට රටේ නිෂ්පාදන කටයුතු සඳහා කෙරෙන ආයෝජන අඩු වේ. එබැවින් නිෂ්පාදනය ද පහළ බසියි. දිගින් දිගට ම නිෂ්පාදන ප්‍රමාණය පහළ බැසීම හා එරට වත්කම් ප්‍රමාණයේ අඩු වීමක් පෙන්නුම් කෙරේ. රටක පවත්නා වත්කම්, සේවා සහ නඩත්තු කටයුතු සඳහා වෙන් කළ පසු සංවර්ධන යෝජනා සඳහා නව නිෂ්පාදන සැලසුම් සඳහා හෝ ආයෝජනය කිරීමට ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවේ. මේ නිසා රටක ගෙවුම් ශේෂ හිඟය පියවා ගැනීමටත්, රටේ ආර්ථික වර්ධනය ඇති කිරීමටත් පිටරටවලින් ලබාගන්නා ආධාර විදේශධාර වශයෙන් හැඳින්විය හැකි ය.

වර්තමාන ලෝකයේ විදේශධාර සපයනු ලබන ක්‍රම කිහිපයකි. ඒවා පරිත්‍යාග ණය, භාණ්ඩ හා සේවා වශයෙන් වර්ග කළ හැකි ය.

විදේශාධාර ක්‍රමය දෙවන ලෝක යුද්ධයෙන් පසු ආරම්භ වුවකි. දෙවන ලෝක යුද්ධය අවසන් වීමෙන් පසු යුරෝපයේ බොහෝ රටවල් බලවත් ආර්ථික පරිහානියකට ගොදුරු විය. මිනිසුන්ගේ ජන ජීවිතය අඩාල වූ අතර ඔවුහු දරිද්‍රතාවයෙන් පෙළෙන්නට වූහ. මේ අභාග්‍ය සම්පන්න තත්ත්වයෙන් යුරෝපාවාසීන් ගොඩගැනීම සඳහා ඇමෙරිකාව විසින් යුරෝපයට ආධාර කිරීම පිණිස සැලසුමක් සකස් කරනු ලැබී ය. එය "මාර්ෂල් සැලැස්ම" නම් විය.

## පරිත්‍යාග

පරිත්‍යාග රටකින් රටකට මෙන් ම ආයතනයකින් රටකට ද සපයනු ලබයි. මුදල්, යන්ත්‍රෝපකරණ, ගොඩනැගිලි හා සේවා වශයෙන් මේවා වර්ග කෙරේ. පරිත්‍යාග බොහෝ විට පිරිනමනු ලබන්නේ කර්මාන්ත, කෘෂිකර්මය, වෛද්‍ය, අධ්‍යාපන හා ධීවර යන අංශ දියුණු කිරීම සඳහා ය. නිදසුන් ලෙස 2004 වර්ෂයේ සුනාමි ව්‍යසනයෙන් පසු ශ්‍රී ලංකාවට ලැබුණු පරිත්‍යාග පෙන්විය හැකි ය.

## ණය වර්ග

ණය විවිධ තේමාවන් හෝ ක්‍රම යටතේ සපයයි. ණය ලබා ගැනීමේ දී සපයනු ලබන රට විසින් හෝ ආයතනය විසින් කොන්දේසි ඉදිරිපත් කරනු ලබයි. සමහර ණය වර්ග පොලී රහිත ව ලැබෙන අතර සමහර ණය වර්ග පොලී සහිත ව ද ලැබේ. පොලී රහිත ණය ලබා ගැනීම දුප්පත් රටවලට වාසිදයක ය. එහෙත් එවැනි ණය ලැබෙන්නේ සුළු වශයෙනි. පොළිය සහිත ණය සැපයීමේ දී ගෙවිය යුතු කාල සීමාව ද කොන්දේසිවලට ඇතුළත් කරයි. දිගුකාලීන ණය සහ කෙටිකාලීන ණය වශයෙන් ණය ගෙවා අවසන්

කිරීමේ කාලසීමාව පදනම් කරගත් ණය වර්ග ද වේ. සමහර රටවල් ණය සැපයීමේ දී එම ණය මුදලින් තම රටෙන් භාණ්ඩ මිල දී ගතයුතු බව නියම කරයි. එවිට එම ණයවලින් ලබාගත හැකි ප්‍රයෝජන සීමාසහිත වේ. එය අවාසිදායක ය. එනිසා කොන්දේසි මත සැපයෙන ණයවලින් එතරම් වාසි සහගත බවක් දක්නට නො ලැබේ.

## භාණ්ඩ හා සේවා

යන්ත්‍රෝපකරණ, වාහන ආදිය ද විදේශාධාර වශයෙන් සැපයේ. අධ්‍යාපන, සෞඛ්‍ය, වාරිමාර්ග, කෘෂිකර්ම හා කර්මාන්ත වැනි ක්ෂේත්‍ර සඳහා ප්‍රයෝජනයට ගත හැකි විවිධ වර්ගයේ යන්ත්‍රෝපකරණ විදේශ ආධාර වශයෙන් අප රටට ලැබී තිබේ. එපමණක් නොව විශ්ව විද්‍යාල, රෝහල් හා වෙනත් ආයතන සඳහා ගොඩනැගිලි, සුනාමියෙන් අවතැන් වුවන් සඳහා නිවාස සහ ගම්මාන පිටරටවලින් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත. වෛද්‍ය, ඉංජිනේරු කෘෂිකර්ම, ධීවර වැනි ක්ෂේත්‍රවල පර්යේෂණ කටයුතු හා පුහුණු කිරීම් ආදිය වෙනුවෙන් විදේශ රටවල විශේෂඥයින්ගේ සේවා අපට ලැබී තිබේ. එසේ ම එම ක්ෂේත්‍රවලින් තෝරාගත් අයට ශිෂ්‍යත්ව පිරිනමා ඒ ඒ රටවල දී අවශ්‍ය පුහුණු වීම් ද ලබා දෙයි. මේ සඳහා ලෝකයේ රටවල් මෙන් ම විවිධ සංවිධාන ද ඉදිරිපත් වී ඇත.

**විදේශාධාර සපයන අන්තර්ජාතික සංවිධානවලට උදාහරණ**

ලෝක බැංකුව/ අන්තර්ජාතික සංවර්ධන සංගමය/ ආසියානු සංවර්ධන බැංකුව/ කොළඹ ක්‍රමය/ ඔපෙක් සංවිධානය

විදේශ වෙළෙඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන  යුරෝපා පොදු වෙළෙඳ හවුල/ උන්ක්ටාඩ් සංවිධානය/ ගැට් සංවිධානය/ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

## සාමය හා සංවර්ධනය

සාමය පවතින විට මානව හිමිකම් මනාව ආරක්‍ෂා වේ. සාමය නොපවතින විට මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය වේ. රටක ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිතවීමට නම් සාමය පැවතිය යුතු ය. මූලික මිනිස් අවශ්‍යතා සම්පූර්ණ වීමට නම් සාමය පැවතිය යුතු අතර මිනිසාට මිනිසත් බව පසක් කර ගැනීමට නම් සාමය තිබිය යුතු ය. මේ අනුව රටක සාමය ආරක්‍ෂා කිරීමට රාජ්‍යය මෙන්ම පුරවැසියන් ද උනන්දු විය යුතු ය. සාමයෙන් තොර ව යහපත් ජීවන තත්ත්වයක් ලබා ගැනීමට හෝ සංවර්ධනය කරා ගමන් කිරීමට ඇති හැකියාව අල්පය.

රටක අභ්‍යන්තර ගැටුම් නැත්නම් අරගල පැවතිය හොත් හෝ බාහිරින් එල්ල වන බලපෑම් දිගින් දිගට ම පැවතියහොත් හෝ එරට ජන ජීවිතය අවුල් සහගත තත්ත්වයට පත් වේ. එබැවින් ජන ජීවිතය සුබිත මුදිත කිරීමට නම් සාමය නිරතුරු ව ම පැවතිය යුතු ය. ඒ සඳහා ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරන ප්‍රධාන ආයතනය වන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානය යි.

එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරමාර්ථය වුයේ ලෝක සාමය සුරක්‍ෂිත කිරීම යි. ඒ සඳහා එක්සත් ජාතීන් විශාල වැඩ කොටසක් සිදුකර ඇත. ආරවුල් යුද්ධ බවට වර්ධනය වීම වළක්වාලීම, අවිබලය වෙනුවට සාකච්ඡා මේසය තෝරා ගැනීමට ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් පෙළඹවීම හෝ ගැටුම් හටගත් විට සාමය ප්‍රතිස්ථාපනය කිරීම පිණිස ආරම්භයේ සිට ම එක්සත් ජාතීන්ගේ සහාය ලැබී ඇත. එක්සත් ජාතීන් මෙම සාම ප්‍රයත්නය දරන ලද්දේ ජාත්‍යන්තර සාමය හා ආරක්‍ෂාව පිළිබඳ ගැටලු නිරාකරණය භාර ප්‍රධාන ආයතනය වන ආරක්‍ෂක මණ්ඩලය මගිනි.

"සංවර්ධනය වෙමින් පවතින රටවලට සාමය හෝ සංවර්ධනය ළඟා කර ගැනීමේ දී ජාත්‍යන්තර සබඳතා අතිශය වැදගත් විය හැකි ය. එහෙත් සාමය හෝ සංවර්ධනය ළඟා කර ගැනීම ජාත්‍යන්තර බලපෑම්වලට යටත් ව නොකළ යුතු ය. නිදහස් ව, නිවහල් ව හා අභිමානවත් ජාතියක් ලෙස තම රටට ගැළපෙන දේශපාලනික, සමාජ, ආර්ථික ක්‍රමවේද ඒ සඳහා අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වනු ඇත. එය ස්ථිර සාමයේත්, සංවර්ධනයේත් පදනම යි."

## සාරාංශය

- ගෝලීයකරණය සංකල්පය සමග ලෝකය එක ම විශ්ව ගම්මානයක් බවට පත් වී ඇත.
- ජාතීන් විවිධ අරමුණු ඉටුකර ගැනීම සඳහා ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගෙන තිබේ.
- භාණ්ඩ හුවමාරුව, තාක්ෂණික දියුණුව, සන්නිවේදන මාධ්‍ය පුළුල් වීම, මානව සම්පත් ප්‍රවර්ධනය, ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය වීම, ජාත්‍යන්තර සබඳතා පුළුල් වීම කෙරෙහි බලපා තිබේ.
- ආනයන අපනයන කටයුතු, ණය ආධාර ලබා ගැනීම, සාම ක්‍රියාවලිය, ආර්ථික කටයුතු, ආරක්ෂක කටයුතු, විදේශ රැකියා සැපයීම වැනි කරුණු ඔස්සේ ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වශයෙන් විවිධාකාර ඍජු හා වක්‍ර බලපෑම්වලට ලක්වීමට සිදු වේ.
- ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමේ දී ජාත්‍යන්තර සංවිධාන මඟින් ඉටු කෙරෙන මෙහෙය අති විශාල ය.
- එක්සත් ජාතීන්ගේ සංවිධානය ලොව පුළුල් ම ජාත්‍යන්තර සංවිධානය වන අතර, එයට අනුබද්ධිත ආයතන විශාල සංඛ්‍යාවක් පවතී.
- ජාත්‍යන්තර සබඳතාවල දී කලාපීය සංවිධානවල කටයුතු ද පුළුල් දායකත්වයක් සපයන අතර, සාර්ක් සංවිධානය දකුණු ආසියානු කලාපයට විශේෂ වූ සංවිධානයකි.
- ජාත්‍යන්තර සම්බන්ධතා මාධ්‍ය ලෙස තානාපති සේවය, වෙළෙඳාම, විදේශාධාර, පරිත්‍යාග, සාමය හා සංවර්ධනය ඉතා වැදගත් වේ.

# විෂය නිර්දේශය - 11වන ශ්‍රේණිය

| මාතෘකාව | විෂය අන්තර්ගතය |
|---|---|
| නීතිය හා යුක්තිය | ● විවිධ නීති වර්ග හා ඒ එක එකකට අදාළ ව රාජ්‍යයේ භූමිකාව.<br>● ශ්‍රී ලංකාවට අදාළ ව නූතන රාජ්‍යයේ අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම.<br>● වත්මන් අධිකරණ පද්ධතිය හා එහි ඓතිහාසික වර්ධනය.<br>● රාජ්‍ය නීති නිලධාරින්ගේ භූමිකා අග්‍ර විනිශ්චයකාරවරයා, නීතිපති, අධිකරණ ඇමති.<br>● අධිකරණ වර්ග, ඒවායේ බලතල හා කාර්යයන් මහේස්ත්‍රාත් අධිකරණ, මහාධිකරණ, අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණය<br>● ආරවුල් බේරුම් කිරීමේ විකල්ප ක්‍රම හඳුන්වාදීමඃ උපදේශනය හා බේරුම්කරණය, ඔම්බුඩ්ස්මන්, මානව හිමිකම් කොමිසම.<br>● නීතියේ ආධිපත්‍යයේ වැදගත්කම සහ සාධාරණ ව හා අප්‍රමාද ව යුක්තිය පසිඳලීමේ වැදගත්කම. |
| ආණ්ඩුවේ විවිධ ස්ථර | ● මධ්‍යම ආණ්ඩුවේ, පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල බලතල හා කාර්යයන්.<br>● පෙර පැවති තත්ත්වයන් හා වර්තමාන ව්‍යුහයන් හඳුන්වාදීම.<br>● ප්‍රාදේශීය ඒකකවලට බලය බෙදා හැරීමේ හේතු සහ පවතින හා මතුවිය හැකි ගැටලු.<br>● අවශ්‍යතා පිළිබඳ සලකා බැලීමේ දී පළාත් සභා හා පළාත් පාලන ආයතනවල ඵලදායි බව.<br>● ආණ්ඩුවේ විවිධ ස්ථරවල පුරවැසියා කෙරෙහි වන වගකීම හා වගවීම මෙන්ම ඒ හා බැඳුණු පුරවැසියන්ගේ වගකීම් හා යුතුකම්. |
| මානව හිමිකම් සහ යුතුකම් | ● එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ ලියවිලි හා ආරම්භක ප්‍රකාශයෙන් අනතුරුව හඳුන්වාදුන් අනෙකුත් ලියවිලි හැඳින්වීම.<br>● ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධ ව්‍යවස්ථා ප්‍රතිපාදනයන්හි වර්ධනය.<br>● මානව හිමිකම් භුක්ති විඳීමේ වර්තමාන තත්වය හා එහි සීමා. |

| | |
|---|---|
| පාරිසරික ගැටලු හා තිරසාර සංවර්ධනය | ● පරිසරය නිර්වචනය හා ඇති විය හැකි පාරිසරික ගැටලු පිළිබඳ දැනුවත් වීම.<br>● භෞතික, සමාජයීය හා ජෛවී පරිසරයන්ට සිදුවන හානිවල බලපෑම.<br>● තිරසාර සංවර්ධනය සංකල්පය හා හානි අවම කිරීමේ පිළියම් පිළිබඳ දැනුම වර්ධනය.<br>● පරිසරය සම්බන්ධයෙන් රජයේ මෙන් ම පුරවැසියන්ගේ වගකීම්. |
| ජාත්‍යන්තර සබඳතා | ● ජාත්‍යන්තර සබඳතාවල අර්ථය හා වැදගත්කම.<br>● බලපෑම් ඇතිකරන රටවල් හා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති විය හැකි බලපෑම.<br>● එක්සත් ජාතීන් හා එයට අනුබද්ධිත සංවිධාන.<br>● සාර්ක් සංවිධානය හා වෙළඳ හවුල් පිළිබඳ ව විශේෂ අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සංවිධාන පිළිබඳ ව අධ්‍යයනය කිරීම.<br>● ජාත්‍යන්තර සබඳතා මාධ්‍යයන් තානාපති සේවය, වෙළඳාම, යුද්ධය, විදේශාධාර, පරිත්‍යාග, සාමය හා සංවර්ධනය. |